# 6

# රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු

## 6.1 සමස්ත නිරීක්ෂණ

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උපාය මාර්ගයන්හි ඉලක්කය වූයේ මැදිකාලීනව තව දුරටත් වර්ධනය කිරීමේ **අපේක්ෂාවන් සහිතව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීමයි.** එම උපායමාර්ගයට සමගාමීව, මෑත කාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය රටෙහි ඉහළ තිරසාර වර්ධනයක් ළඟාකර ගැනීම සහ ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සඳහා ආර්ථික ක්‍රියාකාරකම් දිරිගැන්වීම කෙරෙහි යොමුවිය. ඒ අනුව, බහු විධ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ පැකේජයක් ක්‍රියාත්මක විය. රජයේ ආදායම සම්බන්ධයෙන් බලන කළ, බදු පදනම පුළුල් කිරීම සහ බදු ක්‍රමය සරල කිරීම සඳහා මෙන්ම, ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා නැගී එන අංශ දිරිමත් කිරීමට බදු ප්‍රතිසංස්කරණ හඳුන්වාදෙන ලදී. රාජ්‍ය වියදම් අංශයෙන් සැලකූ විට, රජය විසින් වර්තන වියදම් තාර්කීකරණය සඳහා ක්‍රියාමාර්ග හඳුන්වාදුන් අතර, ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිගැන්වීම සඳහා අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මට්ටමක රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. රාජ්‍ය ණය කළමනාකරණ උපායමාර්ගයේ අවධානය යොමුවූයේ, අවම පිරිවැයක් යටතේ රාජ්‍ය මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලන අතරතුර, අවදානම් විචක්ෂණශීලී මට්ටමක පවත්වා ගැනීම කෙරෙහි විය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2009 වසරේ දී සියයට 9.9 ක් ද, 2010 වසරේ දී සියයට 8.0 ක් ද, 2011 වසරේ දී සියයට 6.9 ක් ද සහ 2012 වසරේ දී සියයට 6.4 ක් ද ලෙස අඛණ්ඩව අඩු විය.

**2012 වසරේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, 2012 - 2015 කාලය සඳහා වූ මැදිකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව සමග අනුගත වෙමින් අයවැය හිඟය තවදුරටත් අඩුකර ගැනීමට මෙන්ම තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා පහසුකම් සලසන්නා වූ ඉහළ ආයෝජන මට්ටමක් පවත්වා ගෙනයාම කෙරෙහි යොමු විය.** ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2011 පැවති සියයට 6.9 සිට 2012 වසරේ දී සියයට 6.2 දක්වා අඩු කිරීමට අපේක්ෂා කරන ලදී. මෙම ඉලක්කය ළඟාකර ගැනීම සඳහා 2011 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 14.3 ක් වූ රජයේ ආදායම සියයට 14.7 දක්වා වැඩිකර ගැනීමට සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වර්තන වියදම 2011 වසරේ දී වූ සියයට 15.4 සිට සියයට 14.8 දක්වා අඩුකර ගැනීමට මෙන්ම, රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙන් සියයට 6.6 ක පමණ පවත්වා ගැනීමට 2012 අයවැය තුළින් අපේක්ෂා කරන ලදී. කෙසේ වුවද, වසර තුළ දී රාජ්‍ය මූල්‍ය ඉලක්ක පවත්වා ගැනීම අභියෝගාත්මක කාර්යයක් වූ අතර, මේ සඳහා හේතු වූයේ විදේශීය අංශයේ ස්ථායීතාවය ශක්තිමත් කිරීම සඳහා ගනු ලැබූ දැඩි ප්‍රතිපත්තීන්හි බලපෑම මත රාජ්‍ය ආදායම සැලකිය යුතු ලෙස පහළයාම සහ දේශීය වෙළෙඳපොළෙහි පැවැති සාපේක්ෂව ඉහළ පොලී අනුපාත හේතුවෙන් පොලී වියදම ඉහළ යාමයි.

**මෙම අභියෝගාත්මක වාතාවරණය තුළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2012 වසරේදී සියයට 6.4 ක පවත්වා ගත් අතර, එය 2011 වසරේ දී වාර්තා කළ සියයට 6.9 ට වඩා අඩු අගයකි.** රාජ්‍ය ආදායම් අඩු වුවද, පුනරාවර්තන වියදම් දැඩි පාලනයකට ලක්කරන අතරතුර ප්‍රමුඛතාව අඩු ප්‍රාග්ධන වියදම් සීමාකිරීම තුළින්, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් 2012 වසරේ දී ඇස්තමේන්තු කළ ඉලක්ක ආසන්නයේ පවත්වාගෙන යාමට රජයට හැකි විය.

වර්තන සහ ප්‍රාග්ධන යන වියදම් දෙවර්ගයේම පාලනය හේතුවෙන් 2012 වසරේ දී මුළු රාජ්‍ය වියදම සහ ශුද්ධ ණයදීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ දී පැවති සියයට 21.4 සිට 2012 වසරේ දී සියයට 19.7 දක්වා අඩු විය. රජය විසින් ප්‍රමුඛතාවයෙන් යුත් ව්‍යාපෘති සඳහා පමණක් ප්‍රාග්ධන වියදම් දැරීම හේතුවෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආයෝජන 2011 වසරේ පැවති සියයට 6.2 ට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 5.5 ක මට්ටමක පවත්වාගෙන යන ලදී. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම කෙරෙහි රජයේ ඇති දැඩි කැපවීම පිළිබිඹු කරමින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පුනරාවර්තන වියදම 2012 වසරේ අයවැය ඉලක්කය වූ සියයට 14.8 ට සහ 2011 වසරේ දී වාර්තා කළ සියයට 15.4 ට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 14.4 දක්වා අඩු විය. ඒ අනුව, පොලී ගෙවීම් රහිත අයවැය හිඟය පිළිබිඹු කෙරෙන ප්‍රාථමික ගිණුමේ හිඟය ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වසරෙහි පැවති සියයට 1.4 සිට 2012 වසරේ දී සියයට 1.1 දක්වා අඩු විය. පුනරාවර්තන වියදම් අඩුවීම හමුවේ වුවද, රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය, ආදායම් රැස්කිරීම පහළ යෑම හේතුවෙන්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ පැවති සියයට 1.1 සිට 2012 වසරේදී සියයට 1.4 දක්වා වැඩි විය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ විදේශ අංශයේ ස්ථායීතාවය ශක්තිමත් කිරීමට ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරෙහි පැවති සියයට 14.3 සිට සියයට 13 දක්වා අඩු විය. අයවැය හිඟය මූල්‍යයනය කිරීමේදී විදේශීය මූලාශ්‍ර කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වූ අතර රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ විදේශීය ආයෝජන ඉහළ යාම, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ විදේශ ව්‍යාපෘති සඳහා ණය ලැබීම් හේතුවෙන්

**6.1 රූප සටහන** **ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




සමස්ත මූල්‍යයන අවශ්‍යතාවයෙන් සියයට 59 ක් සඳහා විදේශීය අංශය දායක විය. ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම මත විදේශ ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද රාජ්‍ය ණය සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුකොට ගෙන මෑතකාලීනව දක්නට ලැබුණු අඩුවීමේ ප්‍රවණතාවය ආපසු හරවමින් 2012 වසරේ දී රාජ්‍ය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 79.1 දක්වා වැඩි විය.

## 6.2 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දිශාව හා ක්‍රියාමාර්ග

2012 වසර සඳහා වූ අයවැය මගින් ප්‍රකාශයට පත්කළ රාජ්‍ය මූල්‍ය උපායමාර්ගයේ අරමුණ වූයේ බදු පදනම පුළුල් කිරීම සඳහා මෑත වර්ෂවල දී හඳුන්වාදුන් බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ සමග අනුකූල වෙමින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, වර්තන වියදම් තාර්කිකරණය කරන අතර තුර රජයේ ආදායම් වැඩි කරගැනීම සඳහා බදු පද්ධතිය සරල කිරීම සහ ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය ආයෝජන පවත්වා ගැනීමයි. මේ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2011 පැවති සියයට 6.9 සිට 2012 දී සියයට 6.2 ක් දක්වා අඩු කිරීමට අපේක්ෂා කරන ලදී. මෙම ඉලක්කයට සමගාමීව අනෙකුත් ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශකවල ද සැලකිය යුතු ප්‍රගතියක් අපේක්ෂා කරන ලදී. වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ශුන්‍ය අගයක් දක්වා අඩුවෙතැයි අපේක්ෂා කළ අතර වර්තමාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් පෙන්නුම් කෙරෙන ප්‍රාථමික ගිණුමේ හිඟය ද 2011 දී පැවති ද.දේ.නි.යෙන් සියයට 1.4 සිට 2012 වසරේ දී ද.දේ.නියෙන් සියයට 1.3 ක් දක්වා අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරිණි. රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 පැවති සියයට 6.2 සිට 2012 දී සියයට 6.6 දක්වා වැඩිවනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

2012 වසරේ දී හඳුන්වාදුන් ආදායම් බදු ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන් යොමු වූයේ ආයෝජන දිරිගැන්වීම සඳහා රට තුළ ආයෝජකයන්ට හිතකර ව්‍යාපාරික පරිසරයක් ඇති කිරීම කෙරෙහි විය. ආයෝජන දිරිමත් කිරීම සඳහා බදු විරාම වැනි විවිධ ආදායම් බදු දිරිගැන්වීම් දේශීය ආදායම් පනතට අනුකූලව වසර තුළදී ලබාදීමට කටයුතු යොදන ලදී. දැනට පවතින බදු විරාම කාලසීමාව කෘෂිකර්මය, තොරතුරු තාක්ෂණය, සංචාරක කර්මාන්තය, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය වැනි කටයුතුවල නිරත වන නව ව්‍යවසායකයන් සඳහා ද දීර්ඝ කරන ලදී. මීට අමතරව, නිශ්චිතව සඳහන් කරන ලද කටයුතුවල නිරත වන කුඩා පරිමාණ ව්‍යවසායකයන් සඳහා අවුරුදු 4 ක බදු විරාම කාලයක්

**6.1 සංඛ්‍යා සටහන** **රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය**

| ශීර්ෂය | 2011 | 2012 අනුමත ඇස්තමේන්තු | 2012 තාවකාලික | 2013 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|
| | රුපියල් මිලියන | | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **949,917** | **1,126,081** | **1,003,915** | **1,277,544** |
| මුළු ආදායම | 934,776 | 1,106,081 | 987,844 | 1,257,544 |
| බදු ආදායම | 812,611 | 1,000,559 | 845,297 | 1,131,041 |
| බදු නොවන ආදායම | 122,166 | 105,522 | 142,547 | 126,503 |
| ප්‍රදාන | 15,141 | 20,000 | 16,071 | 20,000 |
| **වියදම් සහ ආපසු ගෙවීම්** | | | | |
| **අඩුකළ පසු ණය දීම්** | **1,400,097** | **1,594,946** | **1,492,882** | **1,784,944** |
| වර්තන | 1,006,633 | 1,107,902 | 1,094,249 | 1,267,390 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 393,465 | 487,044 | 398,633 | 517,554 |
| එයින් රාජ්‍ය ආයෝජන | 407,488 | 497,465 | 417,131 | 529,250 |
| **වර්තන ගිණුමේ අතිරික්තය (+)/හිඟය (-)** | **-71,856** | **-1,821** | **-106,405** | **-9,846** |
| **ප්‍රාථමික ගිණුමේ අතිරික්තය (+)/හිඟය (-)** | **-93,481** | **-98,865** | **-80,469** | **-62,600** |
| **සමස්ත අයවැය අතිරික්තය (+)/හිඟය (-)** | **-450,180** | **-468,865** | **-488,967** | **-507,400** |
| **මූල්‍යනය** | **450,180** | **468,865** | **488,967** | **507,400** |
| විදේශීය මූල්‍යනය (අ) | 218,956 | 197,264 | 286,455 | 148,000 |
| දේශීය මූල්‍යනය | 231,224 | 271,602 | 202,511 | 359,400 |
| වෙළෙඳපොළ ණය ගැනීම් | 236,022 | 271,602 | 202,511 | 359,400 |
| බැංකු නොවන | 44,171 | 207,602 | 70,984 | 289,400 |
| බැංකු | 191,850 | 64,000 | 131,527 | 70,000 |
| මූල්‍ය අධිකාරිය | 185,848 | ලැ.නො. | 16,101 | ලැ.නො. |
| වාණිජ බැංකු | 6,002 | ලැ.නො. | 115,427 | ලැ.නො. |
| වෙළෙඳපොළ නොවන ණය ගැනීම් | -4,798 | - | - | - |
| | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **14.5** | **15.0** | **13.2** | **14.7** |
| මුළු ආදායම | 14.3 | 14.7 | 13.0 | 14.5 |
| බදු ආදායම | 12.4 | 13.3 | 11.1 | 13.0 |
| බදු නොවන ආදායම | 1.9 | 1.4 | 1.9 | 1.5 |
| ප්‍රදාන | 0.2 | 0.3 | 0.2 | 0.2 |
| **වියදම් සහ ආපසු ගෙවීම්** | | | | |
| **අඩුකළ පසු ණය දීම්** | **21.4** | **21.2** | **19.7** | **20.5** |
| වර්තන | 15.4 | 14.8 | 14.4 | 14.6 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 6.0 | 6.5 | 5.3 | 6.0 |
| එයින් රාජ්‍ය ආයෝජන | 6.2 | 6.6 | 5.5 | 6.1 |
| **වර්තන ගිණුමේ අතිරික්තය (+)/හිඟය(-)** | **-1.1** | **0.0** | **-1.4** | **-0.1** |
| **ප්‍රාථමික ගිණුමේ අතිරික්තය (+)/හිඟය(-)** | **-1.4** | **-1.3** | **-1.1** | **-0.7** |
| **සමස්ත අයවැය අතිරික්තය (+)/හිඟය(-)** | **-6.9** | **-6.2** | **-6.4** | **-5.8** |
| **මූල්‍යනය** | **6.9** | **6.2** | **6.4** | **5.8** |
| විදේශීය මූල්‍යනය (අ) | 3.4 | 2.6 | 3.8 | 1.7 |
| දේශීය මූල්‍යනය | 3.5 | 3.6 | 2.7 | 4.1 |
| වෙළෙඳපොළ ණය ගැනීම් | 3.6 | 3.6 | 2.7 | 4.1 |
| බැංකු නොවන | 0.7 | 2.8 | 0.9 | 3.3 |
| බැංකු | 2.9 | 0.9 | 1.7 | 0.8 |
| මූල්‍ය අධිකාරිය | 2.8 | ලැ.නො. | 0.2 | ලැ.නො. |
| වාණිජ බැංකු | 0.1 | ලැ.නො. | 1.5 | ලැ.නො. |
| වෙළෙඳපොළ නොවන ණය ගැනීම් | -0.1 | - | - | - |

මූලය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

(අ) විදේශීය ආයෝජකයින්, විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සහ විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් වෙත නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් ඇතුළත් ය.

ද, මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අවුරුදු 4 සිට 6 දක්වා බදු විරාම කාලයන් ද ලබා දෙන ලදී. මේ අතර, විශාල ප්‍රමාණයේ ව්‍යවසායයන් සඳහා අවුරුදු 6 සිට 12 දක්වා බදු විරාමයන් ලබාදෙන ලදී. එමෙන්ම, සිමෙන්ති, ඖෂධ, රෙදිපිළි, සහ කිරිපිටි වැනි උපායමාර්ගිකව වැදගත් ආනයන ප්‍රතිස්ථාපන ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ ආදායම් බදු දිරිගැන්වීම් ලබාදෙන ලදී. මේ අතර, සංවර්ධන බැංකු කටයුතු වෙනුවෙන්ම අලුතෙන් පිහිටුවා ඇති වාණිජ බැංකු ශාඛාවන්හි ලාභ සහ ආදායම්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලින් ලැබෙන ආදායම්, සෞඛ්‍ය සේවාවන්, අගය එකතු කළ තේ අපනයනය සහ අත්යන්ත්‍ර රෙදි කර්මාන්ත යනාදිය සඳහා සහනදායී ආදායම් බදු අනුපාතික ලබාදෙන ලදී. මීට අමතරව, ආනයන ප්‍රතිස්ථාපන ව්‍යවසායයන් ආරම්භ කිරීම සඳහා ආනයනය කරන පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ සඳහා බදු විලම්භනය කිරීමේ පහසුකම ලබාදෙන ලදී. තවද, උපාය මාර්ගික වැදගත්කමක් ඇති ව්‍යවසායන් සඳහා තවදුරටත් සහන ලබාදීමේ අරමුණින්, ආර්ථික සේවා ගාස්තුවෙහි සංශෝධනයන් සිදුකරන ලදී. මේ අනුව, ආර්ථික සේවා ගාස්තු සඳහා බදු බැඳියාවෙන් නිදහස් සීමාව වැඩි කරන ලද අතර, ලාභ මත ආදායම් බද්දට යටත්වන ව්‍යාපාර ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් කරන ලදී.

**දේශීය කර්මාන්ත නගා සිටුවීම සහ දේශීය ආර්ථික කටයුතුවලට පහසුකම් සැපයීම සඳහා 2012 අයවැයෙන්, තෝරාගත් අංශ සඳහා එකතු කළ අගය මත බදු සහන ලබාදෙන ලදී.** මේ අනුව, ඖෂධ නිෂ්පාදන සහ කාබනික අපද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්තයන්හි භාවිතය සඳහා ආනයනය කරන යන්ත්‍රෝපකරණ සහ අමතර කොටස් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. තවද, දේශීයව නිෂ්පාදනය කළ ජල විදුලිබල උත්පාදන සඳහා යොදාගනු ලබන යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සැපයීම, දේශීයව නිෂ්පාදනය කළ ටින් මාළු, ටර්බයින, මැටි ආශ්‍රිත නිෂ්පාදන, රාජ්‍ය ආයතන සඳහා සපයන විශේෂිත භාණ්ඩ සහ දේශීයව නිෂ්පාදනය කළ අමුද්‍රව්‍ය භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සැපයීම ආදිය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. දේශීය ප්‍රවාහන අංශයේ ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා ලොරි, ට්‍රක්රථ සහ බස්රථ ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. පර්යේෂණ සහ සංවර්ධන සේවාවන් සැපයීමද එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට 2012 සඳහා වූ අයවැයෙන් යෝජනා කෙරිනි. තවද, උපායමාර්ගික වැදගත්කමක් ඇති ව්‍යවසායයන් සඳහා තවදුරටත් සහන ලබාදීමේ අරමුණින් ජාතිය ගොඩනැගීමේ බද්දෙහි වෙනස්කම් සිදුකරන ලදී. මීට අමතරව, අහස්යානා, නැව්, නූල් සහ රෙදිපිළි ආනයනය සහ අපනයනකරුවන් සඳහා වන විකුණුම් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

**වසර තුළ දී, තෝරාගත් ආනයන ආශ්‍රිත බදු සංශෝධන ගණනාවක් සිදුකරන ලදී.** ඒ අනුව, රටේ ආයෝජන දිරිගැන්වීමේ අරමුණෙන් යුතුව, හඳුනාගත් උපායමාර්ගිකව වැදගත්කමක් ඇති ආනයන ප්‍රතිස්ථාපනය කරනු ලබන ව්‍යවසායන් විසින් ආනයනය කරනු ලබන පිරියත යන්ත්‍ර හෝ උපකරණ සඳහා අදාළ වන තීරු බදු සහ අනෙකුත් ආනයන මත බදු එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලය තුළ දී විලම්භනය කිරීම සඳහා අවසර ලබාදෙන ලදී. වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන් සඳහා ආනයනය කරන උපාංග, ක්‍රීඩා පාවහන්, බලශක්ති පිරිමැසීම ප්‍රවර්ධනය කරන පහන් සහ පරිගණක යනාදිය රේගු බදුවලින් නිදහස් කරන ලදී. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් පහළ යාම සැලකිල්ලට ගෙන ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සඳහා මීට පෙර ලබා දී තිබූ සම්පූර්ණ තීරු බදු අත්හැරීම 2012 මුල් කාලයේදී අඩු කරන ලදී. තවද, මෝටර් රථ අමතර කොටස් සඳහා අදාළ වන තීරු බද්ද වැඩි කරන ලදී. දේශීය මිල මට්ටමේ සිදුවන උච්චාවචනයන් සැලකිල්ලට ගනිමින් දේශීය සැපයුමේ ක්‍රියාකාරිත්වය සහ අන්තර්ජාතික මිල ගණන්වල උච්චාවචනයන් මත පදනම්ව අර්තාපල්, ලොකු ළූණු සහ කරවල වැනි වෙළෙඳ භාණ්ඩ සඳහා අදාළ වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද, වසර තුළ දී වරින්වර සංශෝධනය කරන ලදී. 2012 වසරේ දී දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහාත්, රජයේ ආදායම වැඩි කර ගැනීම සඳහාත් කෑම පිසීමට ගන්නා තෙල් වර්ග, අලුත් හෝ ශීත කළ මසුන් වැනි නව වෙළෙඳ භාණ්ඩ ආනයනය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පනවන ලදී. රජයේ ආදායම ඉහළ නැංවීමේ අරමුණෙන් වියළි එළවළු, සුදුළූණු, ළූණු, පැඟිරි වර්ගයේ පළතුරු සහ තිරිඟු පිටි, වැනි ආනයනික වෙළෙඳ භාණ්ඩ සඳහා සෙස් බද්ද වැඩි කරන ලදී.

**මෝටර් රථ ආනයනය සඳහා අදාළවන නිෂ්පාදන බද්ද, පුළුල් වෙමින් පැවති වෙළෙඳ හිඟය පාලනය කිරීම සඳහා 2012 පළමු කාර්තුවේ දී හඳුන්වාදුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පැකේජයට අනුකූලව වැඩි කරන ලදී.** මේ අනුව, මෝටර් කාර් රථ, වෑන් රථ, ත්‍රී රෝද රථ සහ යතුරු පැදි සඳහා වූ නිෂ්පාදන බද්ද සියයට 6 ත් සියයට 51 ත් අතර පරාසයක් තුල වැඩි කරන ලදී. තවද, රජයේ බදු ආදායම වැඩි කිරීමේ අරමුණෙන් සැර මධ්‍යසාර සහ මෝල්ට් මධ්‍යසාර සඳහා වන සුරා බද්ද වසර තුළදී දෙවරක් ඉහළ නංවන ලද අතර සිගරට් මත වන නිෂ්පාදන බද්ද ද ඉහළ නංවන ලදී.

**2012 වසරේ බදු නොවන ආදායම ඉහළ නැංවීම සඳහා රජය විවිධ ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබීය.** 2012 ජනවාරි මස සිට ලැබෙන සහ ලබාගන්නා ජාත්‍යන්තර ඇමතුම් සඳහා වන විදුලි සංදේශ ගාස්තු ඉහළ දමන ලදී. තවද, මෝටර් රථ සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව ඉහළ දමන ලදී. රටට පැමිණෙන විදේශිය සංචාරකයන් දිරිමත් කිරීම සඳහා අන්තර්ජාලය ඔස්සේ ලබා ගන්නා වූ වීසා සඳහා ගාස්තුව, පෙර පැවති එ.ජ.ඩොලර් 50ක තනි ගාස්තුවක සිට සාර්ක් රටවල පුරවැසියන් සඳහා එ.ජ.ඩොලර් 10 දක්වා ද, අනෙක් රටවල පුරවැසියන් සඳහා එ.ජ.ඩොලර් 20ක් දක්වාද අඩු කරන ලදී.

**බදු ප්‍රතිපත්තිවල සිදුකරන ලද ප්‍රතිසංස්කරණයන් තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහා, බදු පරිපාලනය වැඩිදියුණු කිරීම කෙරෙහි රජය විශේෂ අවධානයක් යොමු කරන ලදී.** බදු ගෙවන්නන්හට සාධාරණ හා අපක්ෂපාතී ලෙස වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබාදීමට මෙන්ම බදු නීති අර්ථ නිරූපණ සම්බන්ධව බදු ගෙවන්නන් හට ඇති ගැටලු නිරාකරණ කර ගැනීමට සහය දැක්වීම සඳහා, බදු අභියාචනා කොමිෂම සහ බදු නීති අර්ථ නිරූපණ කමිටුවෙහි කාර්යයන් වසර තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. තවද, බදු ගෙවන පුද්ගලයින් සංඛ්‍යාව ඉහල නැංවීම සඳහා, ආදායම් රැස්කිරීමේ ආයතනවල විගණන සහ විමර්ශන කටයුතු සිදුකළ අතර විගණන කටයුතු සිදු කරන වාර ගණන වැඩි කරන ලදී. බදු අනුකූලතාවය වැඩි කිරීම, නිසි වේලාවට බදු වාර්තා සැපයීම සහ ස්වතක්සේරු පදනම මත බදු ගෙවීම ඉහළ නැංවීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකා රේගුව විසින් හඳුන්වා දුන් අන්තර්ජාලය ඔස්සේ ලියකියවිලි ලබාදීමේ සහ අන්තර්ජාලය ඔස්සේ ගෙවීම් කිරීමේ පද්ධතිය මගින්, එහි ආදායම් රැස්කිරීම ඉහළ යනු ඇති අතර බදු පදනම පුළුල් වීමද සිදුවනු ඇත. ශ්‍රී ලංකා රේගුවේ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය සහ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා දැනුම සහ හැකියාව වර්ධනය කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. පොදු මහජනතාවගේ බදු පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා බදු සේවා අංශය මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සම්මන්ත්‍රණ පැවත්වීම සිදුකරන ලදී.

**වියදම් අංශය ගැන සලකා බැලීමේ දී, 2012 වසර තුළ රාජ්‍ය වියදම් සකසුරුවම් ලෙස කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී.** ඒ අනුව, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රජයේ ආයතන සඳහා 2012 විසර්ජන පනත් කෙටුම්පත සමග ඉදිරිපත් කරනු ලැබූ 2012 අයවැය ඇස්තමේන්තු මගින් සලසා ඇති පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට දෙකක් ද, ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් සියයට නවයක් ද ඉතිරි කළ යුතු බවට දැනුම් දෙන ලදී. ප්‍රමුඛතා පදනමින් සිදුකළ යුතු නොවන ප්‍රාග්ධන වැඩසටහන්

හඳුනාගැනීමෙන් සහ ප්‍රාග්ධන වියදම් විචක්ෂණශීලීව හා අරපිරිමැස්මෙන් යුතුව දැරීම තුළින් ප්‍රාග්ධන වියදම්වල මෙම ඉතිරිකිරීම් ඇති කරගැනීමට අපේක්ෂා කෙරිණි. මීට අමතරව, බලශක්ති සංරක්ෂණය කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ඉන්ධන හා විදුලිය පරිහරණය සම්බන්ධයෙන් සීමා කිහිපයක් පනවන ලද අතර එමගින් අදාළ වියදම් සීමා කිරීමට හා අවම කර ගැනීමට ද අපේක්ෂා කෙරිණි. ඒ අනුව, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රජයේ ආයතනවල ඉන්ධන හා විදුලිය ආශ්‍රිත වියදම්, 2012 වසරේ අයවැය ඇස්තමේන්තු මගින් ඉන්ධන හා විදුලිය සඳහා සලසා දී ඇති ප්‍රතිපාදන සීමාව ඇතුළත කළමනාකරණය කරගත යුතු වූ අතර කිසිදු අතිරේක ප්‍රතිපාදන ලබාදීමක් හෝ මුදල් රෙගුලාසි ප්‍රතිපාදන යටතේ කිසිඳු මාරු කිරීමක් භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන ලදී.

**2012 වසරේ දී රජයේ සේවකයින්ගේ වැටුප් හා වේතන සහ විශ්‍රාම වැටුප් දීමනා ඉහළ නංවන ලදී.** ඒ අනුව, රාජ්‍ය අංශයේ සියළුම සේවකයන් හට 2011 වසරේ දී ලබාදුන් විශේෂ දීමනාව ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 15 ක් දක්වා වැඩිකරන ලදී. මාණ්ඩලික නොවන පන්තියේ සේවකයන් සඳහා මෙම දීමනා වැඩිවීම 2012 ජනවාරි මස සිට ලබා දුන් අතර, මාණ්ඩලික පන්තියේ සේවකයන් සඳහා මෙම දීමනාවෙන් සියයට 50 ක් 2012 ජනවාරි මස සිට ද ඉතිරිය 2012 ජූලි මස සිට ද ලබාදෙන ලදී. මීට අමතරව, 2012 ජනවාරි මස සිට ග්‍රාම නිලධාරීන්, අධිකරණ සේවා කොමිෂන් සභාවට අයත් විනිශ්චයකාරවරුන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් සහ විශ්ව විද්‍යාල කාර්යය මණ්ඩල සඳහා ගෙවනු ලබන විවිධාකාර වූ දීමනාවන් රැසක් ඉහළ නංවන ලදී. මේ අතර, විශ්‍රාම වැටුප් විෂමතාවයන් ඉවත් කිරීමේ අරමුණෙන් යුතුව 2003 දෙසැම්බර් 31 දින හෝ එයට පෙර විශ්‍රාම ලැබූ රාජ්‍ය සේවකයින් සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප මසකට රුපියල් 1,000 කින් වැඩි කළ අතර 2004 ජනවාරි 01 හා 2005 දෙසැම්බර් 31 අතර කාලයේ විශ්‍රාම ලැබූවන් සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුප මසකට රුපියල් 500 කින් වැඩිකරන ලදී.

**සමාජයේ අවධානමට ලක් වූ කණ්ඩායම් වෙත රජය ලබාදෙන අනුග්‍රහය විවිධ සහනාධාර වැඩසටහන් හරහා තවදුරටත් පුළුල් කරන ලදී.** අඩු ආදායම් ලබන පවුල් සඳහා දෙනු ලබන සමෘද්ධි සහනාධාරය 2012 අප්‍රේල් මස සිට වැඩි කරන ලදී. මීට අමතරව, 2012 පෙබරවාරි මස සිට භූමිතෙල් සහ ඩීසල් මිල වැඩිවීම හේතුවෙන් ඇති වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා ක්‍රියා මාර්ග ගන්නා ලදී. ඒ අනුව, ධීවර කර්මාන්තයේ දී යොදාගනු ලබන භූමිතෙල් යාත්‍රා සහ ඩීසල් යාත්‍රා සඳහා පිළිවෙලින් ලීටරයකට රුපියල් 25 ක සහ ලීටරයකට රුපියල් 12 ක සහනාධාරයක් ලබාදුන් අතර, විදුලිය නොමැති සියළුම කුටුම්භයන් සඳහා මාසිකව රුපියල් 200 ක භූමිතෙල් සහනාධාරයක් ලබාදෙන ලදී.

**ඉහළ ආර්ථික වර්ධනය තිරසාරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපායමාර්ගිකව වැදගත් යටිතල පහසුකම් ව්‍යාපෘති බොහොමයක් ක්‍රියාත්මක කිරීම් කඩිනම් කිරීම සහ ප්‍රාදේශීය වශයෙන් සමබර වූ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට අවශ්‍ය වන ප්‍රාදේශීය යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම අරමුණු කරගනිමින් රාජ්‍ය ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක විය.** ජාතික, පළාත් සහ ග්‍රාමීය මට්ටමෙන් මහාමාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා සැළකිය යුතු ආයෝජනයන් සිදුකරන ලදී. මීට අමතරව, බලශක්ති අංශයේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා මෙන්ම වරාය සංවර්ධනය, දුම්රිය ප්‍රවාහනය, ජල සම්පාදන හා ජලපවාහන සහ වාරිමාර්ග හා ජල කළමනාකරණය වැනි අංශයන්හි වූ ආයෝජන අදාළ කාල පරිච්ඡේදය තුළදී වේගවත් කරන ලදී. මේ අතර, ග්‍රාමීය ප්‍රදේශ ඉලක්කකර ගත් “ගම නැගුම”, “මඟ නැගුම” සහ “දිවි නැගුම” වැනි ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සහ “උතුරු වසන්තය”, “නැගෙනහිර නවෝදය” සහ අනෙකුත් පළාත් සංවර්ධන වැඩසටහන් වැනි ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

**රාජ්‍ය ණය කළමනාකරණ උපාය මාර්ගයේ අවධානය යොමු වූයේ, ප්‍රශස්ත දේශීය හා විදේශීය ණය මිශ්‍රණයක් පවත්වාගෙන යාමෙන් සහ ණය කළඹෙහි කල්පිරීමේ නොගැළපීම් අඩු කර ගැනීමෙන් විචක්ෂණශීලී අවදානම් මට්ටමක් පවත්වා ගන්නා අතර, රජයේ මූල්‍ය අවශ්‍යතා හා ණයසේවාකරණ ගෙවීම් මැදි කාලීනව අවම පිරිවැයක් යටතේ සපුරාලීම සහතික කිරීම කෙරෙහිය.** රජය විසින් වසර 10 ක පරිණත කාලයක් ද සියයට 5.875 ක වාර්ෂික එලදා අනුපාතිකයක් ද සහිතව එ.ජ.ඩොලර් බිලියන 1 ක් වටිනා පස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව නිකුත් කරන ලදී. ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළවල විචලනයන් පැවතිය ද ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවල දී එලදා අනුපාතිකය අඛණ්ඩව අඩු කර ගැනීම තුළින් සාර්ථකවීමට ශ්‍රී ලංකාවට හැකි විය. මීට අමතරව, ණය ප්‍රතිමූල්‍යකරණය කිරීමේ අවදානම අඩු කරමින් කල්පිරීම් ඒකරාශී වීම තුළින් ඇතිවන ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා කල්පිරුණු භාණ්ඩාගාර බිල්පත්වලින් කොටසක් වෙනුවට මැදි හා දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට පියවර ගන්නා ලදී. තවද, ගනුදෙනු කළ හැකි ණය උපකරණ කොටස ඉහළ නැංවීමේ උපායමාර්ගය තවදුරටත් ක්‍රියාත්මක කරමින් 2012 දී කල්පිරුණු ගනුදෙනු කළ නොහැකි රුපියල් ණය වෙනුවට ගනුදෙනු කළහැකි භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී.

ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන රටෙහි ශ්‍රේණිගත කිරීම් සහතික කරන ලදි. ඒ අනුව, ෆිච් (Fitch) ආයතනය ශ්‍රී ලංකාවේ විදේශ ව්‍යවහාර මුදල් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම BB- හා ඉදිරි දැක්ම "ස්ථාවර" ලෙසද මූඩීස් (Moody's) ආයෝජක සේවාව ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම B1 හා ඉදිරි දැක්ම "ධනාත්මක" ලෙසද සහතික කරන ලද අතර, ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් (Standard & Poor's) ආයතනය ශ්‍රී ලංකාවේ B+ ශ්‍රේණිගත කිරීම සහතික කරන ලද අතර ඉදිරි දැක්ම "ධනාත්මක" තත්ත්වයේ සිට "ස්ථාවර" තත්ත්වය දක්වා වෙනස් කරන ලදී.

## 6.3 රජයේ අයවැය කටයුතු

### ආදායම සහ ප්‍රදාන

#### ආදායම

2012 වසරේ දී රජයේ මුළු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, පෙර වසරේ පැවති සියයට 14.3 සහ අයවැයෙන් ඇස්තමේන්තු කළ සියයට 14.7 ට සාපේක්ෂව සියයට 13.0 දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම අඩුවීම මෙයට මුළුමනින්ම හේතු විය. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ඇස්තමේන්තු වලට අනුව විශේෂ ව්‍යාපෘති[1] සඳහා ලබාදුන් එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් හේතුවෙන් රුපියල් බිලියන 20.8 ක් පමණ ද, රජයේ සේවකයින් හට සහනදායී කොන්දේසි මත වාහන ආනයනය කිරීමට ලබා දීම[2] හේතුවෙන් තවත් රුපියල් බිලියන 38.6 ක් ද, 2012 වසරේ දී රජයට අහිමි විය. මෙමගින් 2011 වසරේ දී රජයට අහිමි වූ ආදායම් ප්‍රමාණයන් පිළිවෙළින් රුපියල් බිලියන 8.5 ක් සහ රුපියල් බිලියන 18.3 ක් විය. තවද, පාරිභෝගික භාණ්ඩ ඇතුළුව ආනයන අඩුවීම සහ දේශීය ආර්ථික කටයුතු මන්දගාමී වීම ද වසරේ ආදායම් අඩුවීමට හේතු විය. කෙසේ නමුත්, නාමික වශයෙන් රජයේ ආදායම, පෙර වසරේ පැවති රුපියල් බිලියන 934.8 සිට මෙම වසරේ දී රුපියල් බිලියන 987.8 ක් දක්වා සියයට 5.7 කින් ඉහළ ගියේය. රජයේ ආදායම් රැස්කිරීම් සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට පවත්නා බදු ව්‍යුහය තුළින් ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා කැපවූනු ප්‍රයත්නයක් නුදුරු අනාගතයේ දී අවශ්‍ය වන අතර, නියෝජිත ආයතනයන්හි ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, බදු පරිපාලනය ශක්තිමත්

[1] 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි (ඇ) වගන්තියේ xxiii උපවගන්තියේ සහ (ඌ) වගන්තියේ ii උපවගන්තිය සහ එයට අදාළ සංශෝධන මගින් සඳහන් විශේෂ ව්‍යාපෘති සඳහා ලබාදුන් එකතු කළ අගය මත බදු නිදහස් කිරීම

[2] 2010.12.10 දිනැති අංක 01/2010 දරන වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය අනුව

6.2 රූප සටහන
රාජ්‍ය ආදායමේ සංයුතිය - 2012




කිරීම හා රජයට අයත් වාණිජ ව්‍යවසායයන්හි මූල්‍යමය ශක්‍යතාවයන් ඉහළ නැංවීම තුළින් රජයේ අයවැය මත යැපීම් අවම කරන අතරතුර ලාභ සහ ලාභාංශ ලෙස රජයට ලැබෙන බදු නොවන ආදායම වැඩි කර ගැනීම කෙරෙහි ද අවධානය යොමු විය යුතුය. මෙමගින් ඇති වන ආදායම් අතිරික්තය ප්‍රාග්ධන වියදම් සඳහා භාවිතා කළ හැකි වනු ඇති අතර, එමගින් ණය මගින් සිදුකරන මූල්‍යනය අඩු වනු ඇත.

2012 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම, 2011 වසරේ පැවති සියයට 12.4 සිට සියයට 11.1 දක්වා තව දුරටත් පහත වැටුණ ද, නාමික වශයෙන් එය සියයට 4.0 කින් රුපියල් බිලියන 845.3 ක් දක්වා ඉහළ ගියේය. මුළු බදු ආදායම, 2012 අයවැය ඉලක්කයෙන් සියයට 84.5 ක් වූ අතර, ආනයන මත වූ එකතු කළ අගය මත බද්ද, රේගු බද්ද, ආර්ථික සේවා ගාස්තුව සහ මෝටර් වාහන ආනයනය මත නිෂ්පාදන බද්ද යනාදියෙන් ලද ආදායම් අඩුවීම මෙම හිඟය සඳහා ප්‍රධානම හේතුන් විය. වක්‍ර බදු ආදායම ප්‍රධානතම බදු ආදායම් ප්‍රභවය වූ අතර, 2011 දී මුළු බදු ආදායමෙන් සියයට 80.6 ක් වූ එය 2012 දී මුළු බදු ආදායමෙන් සියයට 79.6 ක් විය. මුළු බදු ආදායමෙන් ආදායම් බදු ප්‍රතිශතය 2011 වසරේ පැවති සියයට 19.4 සිට 2012 වසරේ දී සියයට 20.4 දක්වා ඉහළ ගියේය.

2012 වසරේ ආදායම් බදු රැස්කිරීම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.3 ක් දක්වා සියයට 0.1 කින් සුළු වශයෙන් පහළ ගිය ද, එය නාමික වශයෙන් 2011 වසරේ පැවති රුපියල් බිලියන 157.3 සිට රුපියල් බිලියන 172.6 ක් දක්වා සියයට 9.7 කින් ඉහළ ගියේය. 2012 වසරේ ආදායම් බදු ආදායම වැඩිවීම කෙරෙහි රඳවා ගැනීමේ බදු ආදායමේ ඇති වූ සැලකිය යුතු වර්ධනය දායක විය. අලුතින් නිකුත් කරන ලද

භාණ්ඩාගාර බැඳුම්කරවල පරිමාව හා කල්පිරෙන කාලය ඉහළ යාම, රුපියල් නාමික ණය උපකරණ භාවිතා කර වැඩි වශයෙන් ණය ගැනීම සහ පෙර වසර සමග සැසඳීමේ දී දේශීය වෙළෙඳපොළ තුළ සාපේක්ෂව ඉහළ පොලී අනුපාත පැවතීම ආදී හේතු පිළිබිඹු කරමින්, 2012 වසරේ රඳවා ගැනීමේ බදුවලින් ලද බදු ආදායම රුපියල් බිලියන 59.6 ක් දක්වා සියයට 56.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. විශේෂයෙන්ම බැංකු හා මූල්‍ය සේවා සහ විදේශ වෙළෙඳ කටයුතුවලින් අපේක්ෂිත ආදායම නොලැබීම හේතුවෙන් සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු ආදායම ඉහළ ගියේ ඉතා සුළු වශයෙනි. උපයන විට ගෙවීම් බදු ආදායම ද වසර තුළදී සුළු වශයෙන් පහළ ගියේය. ආර්ථික සේවා ගාස්තුව අය කිරීම සරල කිරීම, බදු නිදහස් කිරීම් ලබාදීම, සහ බදු බැඳියාවෙන් නිදහස් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 25 සිට රුපියල් මිලියන 50 ක් දක්වා ඉහළ නැංවීම යනාදිය පිළිබිඹු කරමින්, ආර්ථික සේවා ගාස්තුවෙන් ලද ආදායම සියයට 30.3 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**එකතු කළ අගය මත බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ පැවති සියයට 3.3 සහ අයවැයෙන් අපේක්ෂා කළ සියයට 3.5 හා සැසඳීමේ දී 2012 වසරේ දී සියයට 2.7 දක්වා පහළ ගියේය.** එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ලබාදීම, වසරේ මුල් කාලයේ දී හඳුන්වාදුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් ආනයන පහතවැටීම සහ මන්දගාමී දේශීය ආර්ථික කටයුතු, 2012 වසරේ එකතු කළ අගය මත බදු ආදායම පහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. නාමික වටිනාකම් අනුවද එකතු කළ අගය මත බදු ආදායම 2011 වසරේ පැවති රුපියල් බිලියන 215.6 සිට 2012 වසරේ දී රුපියල් බිලියන 204.8 ක් දක්වා සියයට 5.0 කින් පහළ ගිය අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් ආනයන මත වූ එකතුත කළ අගය මත බදු ආදායම පහළ යෑම හේතු විය. ඒ අනුව, මුළු බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස එකතු කළ අගය මත බදු ආදායම 2010 පැවති සියයට 30.4 සහ 2011 පැවති සියයට 26.5 සිට 2012 දී සියයට 24.2 දක්වා පහත වැටුණි. දේශීය භාණ්ඩ හා සේවා සැපයීම මත එකතු කළ අගය මත බදු ආදායම රුපියල් බිලියන 105.3 ක් දක්වා සියයට 2.0 කින් ඉහළ ගියේය. ආනයන මත එකතු කළ අගය මත බදු ආදායම රුපියල් බිලියන 99.4 ක් දක්වා සියයට 11.4 කින් පහළ ගිය අතර මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ විශේෂයෙන්ම මෝටර් වාහන ඇතුළු ආනයන අඩුවීම සහ උපායමාර්ගික ආයෝජන ව්‍යාපෘති සඳහා ආනයනය කරන ද්‍රව්‍ය බදු වලින් නිදහස් කිරීමයි. තවද, මුළු බදු ආදායමෙන් දේශීය භාණ්ඩ හා සේවා සැපයීම මත එකතු කළ අගය මත බදු ආදායම 2011 දී පැවති සියයට 12.7 සිට 2012 දී සියයට 12.5 දක්වා පහළ ගියේය.

**නිෂ්පාදන බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් 2011 දී පැවති සියයට 2.8 සිට 2012 දී සියයට 2.5 දක්වා පහළ ගිය අතර මෝටර් රථ වාහන ආනයනය මත නිෂ්පාදන බදු ආදායම පහළ යාම මෙම අඩුවීමට හේතු විය.** කෙසේ වෙතත්, නාමික වශයෙන් නිෂ්පාදන බදු ආදායම 2011 දී වූ රුපියල් බිලියන 186 සිට 2012 දී රුපියල් බිලියන 191.9 ක් දක්වා සියයට 3.2 කින් වැඩි විය. මේ අතර, මුළු බදු ආදායමෙන් නිෂ්පාදන බදු ආදායමේ ප්‍රතිශතය 2011 දී වූ සියයට 22.9 සිට 2012 දී සියයට 22.7 දක්වා පහත වැටුණි. මෝටර් රථ ආනයනය මත වූ නිෂ්පාදන බදු ආදායම පෙර වසරේ පැවැති රුපියල් බිලියන 52.8 සිට මෙම වසරේ දී රුපියල් බිලියන 46.5 ක් දක්වා සියයට 12 කින් අඩු විය. මත්පැන් සඳහා වන සුරාබදු අනුපාතිකයන් ඉහළ දැමීම සහ මෝල්ට් මධ්‍යසාර නිෂ්පාදනය ඉහළ යාම හේතුවෙන් වසර තුළ සුරාබදු ආදායම රුපියල් බිලියන 60.1 ක් දක්වා සියයට 8.7 කින් ඉහළ ගියේය. සිගරට් අලෙවිය සියයට 4.3 කින් පහත වැටුණ ද, වසර තුළ දී කාලීනව සිගරට් සඳහා නිෂ්පාදන බදු අනුපාතයන් සංශෝධනය කිරීම හේතුවෙන් සිගරට් සහ දුම්කොළ මත වූ නිෂ්පාදන බදු ආදායම රුපියල් බිලියන 53.6 ක් දක්වා සියයට 7.9 කින් වැඩි විය. පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන වැඩිවීම හේතුවෙන් 2012 වසරේ දී ඛනිජ තෙල් ආනයන මත නිෂ්පාදන බදු සියයට 26.7 කින් ඉහළ ගියේය.

**6.2 සංඛ්‍යා සටහන — ආර්ථික වර්ගීකරණයට අනුව ආදායම**

| ශීර්ෂය | 2011 | 2012 අනුමත ඇස්තමේන්තු | 2012 තාවකාලික | 2013 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|
| රුපියල් මිලියන | | | | |
| **බදු ආදායම** | **812,611** | **1,000,559** | **845,297** | **1,131,041** |
| ආදායම් බදු | 157,309 | 190,270 | 172,593 | 221,984 |
| එකතුකළ අගය මත බදු | 215,576 | 264,917 | 204,806 | 283,354 |
| නිෂ්පාදන බදු | 186,010 | 223,125 | 191,947 | 247,256 |
| ආනයන මත බදු | 75,974 | 93,830 | 73,489 | 97,303 |
| අනෙකුත් බදු | 177,742 | 228,417 | 202,462 | 281,144 |
| **බදු නොවන ආදායම** | **122,166** | **105,522** | **142,547** | **126,503** |
| **මුළු ආදායම** | **934,776** | **1,106,081** | **987,844** | **1,257,544** |
| ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | | | | |
| **බදු ආදායම** | **12.4** | **13.3** | **11.1** | **13.0** |
| ආදායම් බදු | 2.4 | 2.5 | 2.3 | 2.6 |
| එකතුකළ අගය මත බදු | 3.3 | 3.5 | 2.7 | 3.3 |
| නිෂ්පාදන බදු | 2.8 | 3.0 | 2.5 | 2.8 |
| ආනයන මත බදු | 1.2 | 1.3 | 1.0 | 1.1 |
| අනෙකුත් බදු | 2.7 | 3.0 | 2.7 | 3.2 |
| **බදු නොවන ආදායම** | **1.9** | **1.4** | **1.9** | **1.5** |
| **මුළු ආදායම** | **14.3** | **14.7** | **13.0** | **14.5** |

මූලය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

**2012 දී ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවති සියයට 0.5 ක මට්ටමේම පැවති අතර, නාමික වශයෙන් 2011 වසරේ දී රුපියල් බිලියන 35.7 ක් වූ එය 2012 වසරේ දී රුපියල් බිලියන 38.7 ක් දක්වා සියයට 8.6 කින් ඉහළ යන ලදී.** සංචාරක හා ඉදිකිරීම් කටයුතුවල වර්ධනය හේතුවෙන් දේශීය භාණ්ඩ හා සේවා මත වූ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රුපියල් බිලියන 23.1 ක් දක්වා සියයට 21.2 කින් වැඩි විය. තවද, තොග සහ සිල්ලර වෙළෙඳාමෙහි නියුතු ව්‍යාපාර ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වීම් වැඩිවීම ද, මෙම කාලය තුළ බදු රැස්කිරීම් ඉහළ යාමට හේතු විය. කෙසේ නමුත්, සමස්ත ආනයනවල අඩුවීම හේතුවෙන්, ආනයන මත වූ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රුපියල් බිලියන 15.7 ක් දක්වා සියයට 5.8 කින් පහත වැටුණි.

**2012 වසරේ දී රේගු බදු සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදුවලින් ලද මුළු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 දී පැවති සියයට 1.4 අගයේම පැවති අතර, නාමික අගය රුපියල් බිලියන 107.2 ක් දක්වා සියයට 17.0 කින් ඉහළ යන ලදී.** රේගු බදු ආදායම 2012 අයවැයෙන් සියයට 23.4 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කළ ද, 2012 දෙවන කාර්තුවේ සිට ආනයන පහළ යාම හේතුවෙන් එය රුපියල් බිලියන 73.5 ක් දක්වා සියයට 3.3 කින් පහත වැටුණි. රේගු බදු ආදායම මුළු බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2011 පැවති සියයට 9.3 සිට 2012 දී සියයට 8.7 දක්වා සැලකිය යුතු ලෙස පහළ වැටුණි. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඇතුළුව සාමාන්‍ය රේගු බදු අනුපාතය 2011 පැවති සියයට 4.1 සිට 2012 දී සියයට 4.4 දක්වා ඉහළ ගියේය. තවද, ආනයන අඩු කිරීම සඳහා ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හා රුපියල අවප්‍රමාණය වීම මත වසර තුළ දී මෝටර් රථ වාහන ආනයනය පහළ යාම හේතුවෙන් මෝටර් රථ වාහන ආනයනයෙන් ලද රේගු බදු ආදායම 2011 වසරේ වූ රුපියල් බිලියන 28.4 සිට සියයට 50 කින් අඩු වී රුපියල් බිලියන 14.1 ක් විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම 2011 වසරේ පැවති රුපියල් බිලියන 15.6 සිට 2012 දී රුපියල් බිලියන 33.7 ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, මසුන්, සෝයා බෝංචි තෙල්, පාම් තෙල්, සූරියකාන්ත තෙල් සහ පොල් තෙල් වැනි නව වෙළෙඳ භාණ්ඩ සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පැනවීම මෙම ඉහළ යාමට හේතු විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම මුළු බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2011 දී සියයට 1.9 සිට 2012 දී සියයට 4.0 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.

**2012 දී අනෙකුත් බදු වර්ගවලින් ලද ආදායම් මිශ්‍ර ප්‍රතිඵල පෙන්වන ලදී.** වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 පැවති සියයට 1.0 සිට 2012 දී සියයට 0.9 දක්වා පහත වැටුණි. කෙසේ නමුත්, නාමික වශයෙන් එය 2011 දී පැවති රුපියල් බිලියන 66.4 සිට 2012 දී රුපියල් බිලියන 70.1 ක් දක්වා සියයට 5.5 කින් වර්ධනය වූ අතර, අඩු බදු නිදහස් කිරීම් පැවතීම සහ පුළුල් බදු පදනම මේ සඳහා හේතු විය. 2011 දී නාමික වශයෙන් රුපියල් බිලියන 29.6 ක් වූ සෙස් බදු ආදායම 2012 දී රුපියල් බිලියන 32.7 ක් දක්වා සියයට 10.4 කින් ඉහළ ගියේය. 2012 වසරේ මුල් කාලයේදී අලුතින් භාණ්ඩ කිහිපයක් සඳහා සෙස් බදු හඳුන්වාදීම වසර තුල සෙස් බදු ආදායම ඉහල යෑමට ප්‍රධාන ලෙස හේතු විය. දුරකථන ඝනත්වය ඉහළ යාම හේතුවෙන් විදුලි සංදේශ බදු ආදායම පෙර වසරේ පැවති රුපියල් බිලියන 18.6 සිට 2012 දී රුපියල් බිලියන 22.3 ක් දක්වා සියයට 19.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් බදු ආදායම 2011 පැවති රුපියල් බිලියන 7.4 ක මට්ටමේ සිට 2012 දී රුපියල් බිලියන 4.9 ක් දක්වා සියයට 33.9 කින් පහත වැටුණි.

**2012 දී බදු නොවන ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ මෙන් සියයට 1.9 ක්ව පැවති අතර, එය අයවැය මඟින් ඉලක්ක කළ මට්ටමට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයකි.** බදු නොවන ආදායමෙහි නාමික අගය 2011 වසරේ පැවති රුපියල් බිලියන 122.2 සිට 2012 වසරේ දී රුපියල් බිලියන 142.5 දක්වා සියයට 16.7 කින් වර්ධනය වූ අතර, 2012 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද ලාභ පැවරීම් රුපියල් බිලියන 43 දක්වා සියයට 95.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. රාජ්‍ය ව්‍යවසායයන් මඟින් ලද ලාභ හා ලාභාංශ පැවරීම් 2011 වසරේ පැවති රුපියල් බිලියන 34.3 ට සාපේක්ෂව රුපියල් බිලියන 46.8 දක්වා සියයට 36.1 කින් වර්ධනය විය. කෙසේ නමුත්, බදු නොවන ආදායමෙන් සියයට 18 කට වඩා ප්‍රමාණයක් නිරූපණය කරන ගාස්තු සහ අයකිරීම්, 2011 වසරේ පැවති රුපියල් බිලියන 37.3 ට සහ රුපියල් බිලියන 30.2 ක් වූ අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව රුපියල් බිලියන 26 ක් දක්වා විශාල වශයෙන් අඩු විය. අයවැයෙහි ඇස්තමේන්තු කළ පරිදි 2012 වසරේ දී සමාජ ආරක්ෂණ දායක මුදල්, පොලී ආදායම සහ කුලී ආදායම වැනි අනෙකුත් බදු නොවන ආදායම් පෙර වසරට සාපේක්ෂව අඩුවිය. මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම 2011 වසරේ පැවති සියයට 13.1 සිට 2012 වසරේ දී සියයට 14.4 දක්වා වැඩි විය.

### ප්‍රදාන

2012 වසරේ දී විදේශ ප්‍රදාන ලැබීම් වාර්ෂික ඇස්තමේන්තුව වූ රුපියල් බිලියන 20 ට වඩා අඩු වුවත්, 2011 වසරේ පැවති රුපියල් බිලියන 15.1 සිට රුපියල් බිලියන 16.1 දක්වා සියයට 6.1 කින් වැඩි විය. 2012 වසරේ දී බහුපාර්ශ්වීය ආධාරකරුවන්ගෙන් ලද විදේශ ප්‍රදාන 2011 වසරේ පැවති රුපියල් බිලියන 12.1 සිට රුපියල් බිලියන 7.2 දක්වා සියයට 42 කින් අඩු විය. ඒ අනුව වෙමින් 2011 වසරේ දී මුළු ප්‍රදානයන්ගෙන් සියයට 80 ක්ව පැවති බහුපාර්ශ්වීය ආධාරවලින් ලද ප්‍රදාන 2012 වසරේදී සියයට 45 ක් දක්වා අඩු විය. මීට වෙනස්ව, 2012 වසරේ ද්වීපාර්ශ්වීය ආධාරකරුවන්ගෙන් ලද ප්‍රදාන 2011 වසරේ පැවති රුපියල් බිලියන 3.0 සිට 2012 වසරේ දී රුපියල් බිලියන 8.9 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය.

### වියදම් හා ශුද්ධ ණයදීම්

පුනරාවර්තන වියදම් පාලනය කිරීමට රජය ගත් ප්‍රයත්නයන් මෙන්ම රාජ්‍ය ආදායමේ සිදු වූ අඩුවීම නිසා රාජ්‍ය ආයෝජන අපේක්ෂා කළ මට්ටමට වඩා අඩුවීම පිළිබිඹු කරමින්, මුළු වියදම් හා ශුද්ධ ණයදීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ පැවති සියයට 21.4 සහ අයවැය මගින් අපේක්ෂා කළ සියයට 21.2 ට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 19.7 දක්වා අඩු විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මුළු වියදම් හා ශුද්ධ ණය දීම්වල සිදුවූ අඩුවීම, පුනරාවර්තන වියදම් ප්‍රතිශත අංක 1.0 කින් අඩුවීමේත් ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් ප්‍රතිශත අංක 0.7 කින් අඩුවීමේත් ඒකාබද්ධ ප්‍රතිඵලයකි. කෙසේ වෙතත් නාමික වශයෙන්, මුළු වියදම් හා ශුද්ධ ණය දීම් 2011 වසරේ වූ රුපියල් බිලියන 1,400.1 ට සාපේක්ෂව 2012 වසරේ දී රුපියල් බිලියන 1,492.9 දක්වා සියයට 6.6 කින් වැඩි විය.

පුනරාවර්තන වියදම් තාර්කිකරණය කිරීම සඳහා වූ රජයේ කැපවීම පෙන්නුම් කරමින් 2012 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පුනරාවර්තන වියදම් 2011 වසරේ වාර්තා වූ සියයට 15.4 සිට සියයට 14.4 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. වැටුප් හා වේතන සහ රජයේ අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පහළ යාම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, පොලී ගෙවීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සුළු වශයෙන් අඩු වූ අතර විශ්‍රාම වැටුප් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවති මට්ටමේම පැවතිණි. 2012 වසරේ පුනරාවර්තන වියදම්හි නාමික අගය පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 1,006.6 ට සාපේක්ෂව රුපියල් බිලියන 1,094.2 දක්වා සියයට 8.7 කින් වැඩි විය. කෙසේ වෙතත්, 2012 වසරේ දී පොලී ගෙවීම් අයවැය මගින් ඉලක්ක කළ මට්ටමට වඩා රුපියල් බිලියන 38.5 කින් වැඩි වුවද, වසරේ සමස්ත පුනරාවර්තන වියදම් අයවැය මගින් අපේක්ෂා කළ රුපියල් බිලියන 1,107 ට වඩා රුපියල් බිලියන 13.7 කින් අඩු විය.

**6.3 රූප සටහන** රාජ්‍ය වර්තන වියදමේ සංයුතිය - 2012




2012 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම් පෙර වසරේ වාර්තා වූ සියයට 5.5 සිට සියයට 5.4 දක්වා සුළු වශයෙන් අඩු විය. කෙසේ වෙතත්, නාමික වශයෙන් පොලී ගෙවීම් 2011 වසරේ වූ රුපියල් බිලියන 356.7 සහ අයවැය මගින් අපේක්ෂා කළ රුපියල් බිලියන 370 ට සාපේක්ෂව 2012 වසරේ දී රුපියල් බිලියන 408.5 දක්වා වැඩි වූ අතර, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණ වීම සහ 2012 වසරේ පළමු භාගය තුළ දේශීය වෙළෙඳපොළ තුළ පොලී අනුපාතික සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතීම ඒ සඳහා හේතු විය. මේ අතර, පොලී ගෙවීම් පුනරාවර්තන වියදම්වල විශාලතම තනි අයිතමය ලෙස තවදුරටත් පැවැති අතර, එය 2012 වසරේ සමස්ත පුනරාවර්තන වියදමෙන් සියයට 37.3 ක් මෙන්ම සමස්ත රාජ්‍ය ආදායමෙන් සියයට 41.4 ක් විය.

2012 වසරේ දී දේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් රුපියල් බිලියන 317.7 දක්වා සියයට 10.2 කින් වැඩි වූ අතර, විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් රුපියල් බිලියන 90.8 දක්වා සියයට 32.5 කින් වැඩි විය. නොපියවූ දේශීය ණය ප්‍රමාණය 2011 වසරේ දී සියයට 9.3 කින් ඉහළ යාමත්, දේශීය ණය මත වූ සාමාන්‍ය පොලී අනුපාතිකය පසුගිය වසරේ වූ සියයට 11.2 සිට සියයට 11.3 දක්වා සුළු වශයෙන් වැඩි වීමත්, දේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් ඉහළ යාමට හේතු විය. දේශීය අංශය තුළ, භාණ්ඩාගාර බැඳුම්කර මත වූ පොලී ගෙවීම් 2012 වසරේ දී රුපියල් බිලියන 237.7 දක්වා

සියයට 9.8 කින් වැඩි වූ අතර ඒ සඳහා ණය ගැනීමේ ප්‍රධාන උපකරණය ලෙස නොපිය වූ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය 2010 වසරේ දී සියයට 8.6 කින් සහ 2011 වසරේ දී සියයට 10.7 කින් වැඩි වීම හේතු විය. භාණ්ඩාගාර බිල්පත් මත පොලී ගෙවීම් 2012 වසරේ දී රුපියල් බිලියන 65 දක්වා සියයට 40.6 කින් විශාල ලෙස ඉහළ ගිය අතර, නොපිය වූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 2011 වසරේ දී සියයට 14.9 කින් සහ

**6.3 සංඛ්‍යා සටහන — ආර්ථික වර්ගීකරණයට අනුව වියදම සහ ශුද්ධ ණය දීම්**

| ශීර්ෂය | 2011 | 2012 අනුමත ඇස්තමේන්තු | 2012 තාවකාලික | 2013 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|
| | රුපියල් මිලියන | | | |
| **වර්තන වියදම්** | **1,006,633** | **1,107,902** | **1,094,249** | **1,267,390** |
| භාණ්ඩ හා සේවා වියදම | 433,331 | 501,503 | 449,206 | 554,838 |
| එයින් වැටුප් හා වේතන | 319,601 | 367,980 | 347,747 | 414,446 |
| පොලී ගෙවීම් | 356,699 | 370,000 | 408,498 | 444,800 |
| විදේශීය | 68,565 | 48,000 | 90,839 | 85,000 |
| දේශීය | 288,134 | 322,000 | 317,659 | 359,800 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 216,602 | 236,400 | 236,544 | 267,752 |
| එයින් කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 171,438 | 186,336 | 189,747 | 215,966 |
| සමෘද්ධි | 9,044 | 12,900 | 10,553 | 14,208 |
| විශ්‍රාම වැටුප් | 99,936 | 111,353 | 111,682 | 129,100 |
| පොහොර සහනාධාර | 29,802 | 33,800 | 36,456 | 37,800 |
| අනෙකුත් | 32,656 | 28,283 | 31,056 | 34,858 |
| **ප්‍රාග්ධන වියදම්** | **363,001** | **448,732** | **373,240** | **498,179** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 202,627 | 264,289 | 170,508 | 296,397 |
| ප්‍රාග්ධන පැවරුම් | 160,374 | 214,678 | 202,732 | 210,383 |
| ඌණ වියදම් සඳහා වෙන්කිරීම් | - | -30,235 | - | -8,600 |
| **ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම්** | **30,464** | **38,312** | **25,394** | **19,375** |
| **මුළු වියදම සහ ශුද්ධ ණය දීම්** | **1,400,097** | **1,594,946** | **1,492,882** | **1,784,944** |
| | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | | | |
| **වර්තන වියදම්** | **15.4** | **14.8** | **14.4** | **14.6** |
| භාණ්ඩ හා සේවා වියදම | 6.6 | 6.7 | 5.9 | 6.4 |
| එයින් වැටුප් හා වේතන | 4.9 | 4.9 | 4.6 | 4.8 |
| පොලී ගෙවීම් | 5.5 | 4.9 | 5.4 | 5.1 |
| විදේශීය | 1.1 | 0.6 | 1.2 | 1.0 |
| දේශීය | 4.4 | 4.3 | 4.2 | 4.1 |
| වර්තන පැවරුම් හා සහනාධාර | 3.3 | 3.1 | 3.1 | 3.1 |
| එයින් කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට | 2.6 | 2.5 | 2.5 | 2.5 |
| සමෘද්ධි | 0.1 | 0.2 | 0.1 | 0.2 |
| විශ්‍රාම වැටුප් | 1.5 | 1.5 | 1.5 | 1.5 |
| පොහොර සහනාධාර | 0.5 | 0.5 | 0.5 | 0.4 |
| අනෙකුත් | 0.5 | 0.4 | 0.4 | 0.4 |
| **ප්‍රාග්ධන වියදම්** | **5.5** | **6.0** | **4.9** | **5.7** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 3.1 | 3.5 | 2.2 | 3.4 |
| ප්‍රාග්ධන පැවරුම් | 2.5 | 2.9 | 2.7 | 2.4 |
| ඌණ වියදම් සඳහා වෙන් කිරීම් | - | -0.4 | - | -0.1 |
| **ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම්** | **0.5** | **0.5** | **0.3** | **0.2** |
| **මුළු වියදම සහ ශුද්ධ ණය දීම්** | **21.4** | **21.2** | **19.7** | **20.5** |

මූලය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

2012 වසරේ දී සියයට 6.5 කින් ඉහළ යාමත්, දේශීය වෙළෙඳපොළ තුළ වූ පොලී අනුපාතික සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතීමත් මේ සඳහා හේතු විය. රුපියල් ණය සුරැකුම්පත් හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා වූ පොලී ගෙවීම් පිළිවෙළින් රුපියල් බිලියන 6.4 සහ රුපියල් බිලියන 8.9 බැගින් විය. මේ අතර, 2012 වසරේ සමස්ත පොලී ගෙවීම්වලින් සියයට 78 ක් දේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් වූ අතර එය පසුගිය වසරේ දී සියයට 81 ක් විය. විදේශීය අංශය තුළ, 2011 වසරේ දී නොපිය වූ විදේශ ණය ප්‍රමාණය සියයට 15.5 කින් ඉහළ යාමත්, මුළු විදේශීය ණයවල අඩංගු සහනදායී නොවන ණය ප්‍රතිශතය සියයට 43 සිට 2012 වසරේ දී සියයට 49 දක්වා වැඩිවීමත්, වසර තුළ විදේශ ණය මත වූ සාමාන්‍ය පොලී අනුපාතිකය පෙර වසරේ පැවති සියයට 3.4 සිට සියයට 3.9 දක්වා වැඩිවීමට හේතු විය.

2012 වසරේ දී වැටුප් හා වේතන සඳහා වූ වියදම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ වූ සියයට 4.9 සිට සියයට 4.6 දක්වා අඩු වුවද, නාමික වශයෙන් එය රුපියල් බිලයන 347.7 දක්වා සියයට 8.8 කින් වැඩි විය. සියලුම රාජ්‍ය සේවකයන් සඳහා ලබා දුන් විශේෂ දීමනාව සිය මූලික වැටුපෙන් සියයට 5 ක සිට සියයට 15 දක්වා වැඩි කිරීමත්, ග්‍රාම නිලධාරීන්, විනිශ්චයකාරවරුන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවරුන් සහ විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල සඳහා ගෙවනු ලබන විවිධ දීමනාවන් ඉහළ නැංවීමත් 2012 වසර තුළ වැටුප් හා වේතනවල නාමික වටිනාකම ඉහළ යාමට හේතු විය. ආරක්ෂක කටයුතු සහ පොදු නීතිය හා ආරක්ෂාව ඇතුළු මධ්‍යම රජයේ සේවකයන්ගේ වැටුප් හා වේතන 2012 වසරේ දී රුපියල් බිලියන 259.5 දක්වා සියයට 13.4 කින් වැඩි වුවද, පළාත් සභාවල සේවකයින්ගේ වැටුප් හා වේතන සඳහා වූ මධ්‍යම රජයේ දායකත්වය රුපියල් බිලියන 88.2 දක්වා සියයට 2.9 කින් පහළ යාම වසර තුළ දී වැටුප් හා වේතනවල නාමික වටිනාකම ඉහළ යාම සීමා කිරීමට හේතු විය. මේ අතර, වැටුප් හා වේතන පුනරාවර්තන වියදම්වල දෙවන විශාලතම අයිතමය වූ අතර එය 2012 වසරේ සමස්ත පුනරාවර්තන වියදමෙන් සියයට 32 ක් විය.

රජයේ අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ වූ සියයට 1.7 සිට 2012 වසරේ දී සියයට 1.3 දක්වා අඩු විය. නාමික වශයෙන්, අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම් 2011 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 113.7 සිට රුපියල් බිලියන 101.5 දක්වා අඩු විය. 2012 වසරේ දී මධ්‍යම රජය විසින් අනෙකුත් භාණ්ඩ හා සේවා

**6.4 රූප සටහන** **කාර්යයන් අනුව වියදම් වර්ගීකරණය - 2012**




සඳහා දරන ලද වියදම සියයට 1.2 කින් සුළු වශයෙන් වැඩි වූ අතර, එය වසර තුළ දී අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා වූ සමස්ත වියදමෙන් සියයට 53 ක් විය. අනෙක් අතට ආරක්ෂක සේවා මගින් අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා දරන ලද වියදම මෙම වකවානුව තුළ දී සියයට 27 කින් පහත වැටුණි. 2012 වසර තුළ අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා ආරක්ෂක සේවා විසින් දරන ලද වියදමේ අඩු වීම පිළිබිඹු කරමින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආරක්ෂක වියදම් ද ක්‍රමයෙන් පහළ යන ලදී.

**වර්තන පැවරුම් හා සහනාධාර ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් පෙර වසරේ වාර්තා වූ සියයට 3.3 ට සාපේක්ෂව 2012 වසරේ දී සියයට 3.1 දක්වා අඩු විය.** කෙසේ වෙතත්, නාමික වශයෙන්, වර්තන පැවරුම් හා සහනාධාර 2011 වසරේ වූ රුපියල් බිලියන 216.6 සිට 2012 වසරේ දී රුපියල් බිලියන 236.5 දක්වා සියයට 9.2 කින් වැඩි විය. කුටුම්භ අංශය වර්තන පැවරුම්වලින් වැඩි වශයෙන්ම ප්‍රතිලාභ ලබන අංශය ලෙස තවදුරටත් පැවති අතර, එය 2012 වසරේ මුළු වර්තන පැවරුම්වලින් සියයට 80 ක් විය. ඉතිරිය රාජ්‍ය ආයතන හා රාජ්‍ය සංස්ථා වෙත කරන ලද වර්තන පැවරුම්වලින් සමන්විත වූ අතර, එය 2012 වසරේ මුළු වර්තන පැවරුම්වලින් පිළිවෙළින් සියයට 15 සහ සියයට 5 බැගින් විය.

**කුටුම්භ වෙත කරන ලද වර්තන පැවරුම් 2012 වසරේ දී රුපියල් බිලියන 189.7 දක්වා සියයට 10.7 කින් වැඩි වූ අතර, විශ්‍රාම වැටුප් ගෙවීම හා පොහොර සහනාධාරයට අදාළ වියදම් ඉහළ යාම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.** විශ්‍රාම වැටුප් ගෙවීම් කුටුම්භ වෙත කරන ලද පැවරුම්වලින් ප්‍රධාන අයිතමය ලෙස තවදුරටත් පැවති අතර, එය 2012 වසරේ කරන ලද පැවරුම්වලින් සියයට 59 ක් විය. නාමික වශයෙන්, විශ්‍රාම වැටුප් ගෙවීම් 2012 වසරේ දී රුපියල් බිලියන 111.7 දක්වා සියයට 11.8 කින් වැඩි විය. විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ අරමුණින් විශ්‍රාම වැටුප්වල සිදුවූ වැඩිවීමත්, 2011 වසරේ දී 23,447 ක් විශ්‍රාමිකයන් ලෙස එක්වීමේ සම්පූර්ණ බලපෑමත්, 2012 වසරේ දී 17,375 ක් අළුතින් විශ්‍රාමිකයන් ලෙස ඇතුලත්වීමේ ආංශික බලපෑමත් මෙම වැඩිවීමට හේතු විය. 2012 වසරේ දී පොහොර සහනාධාරය සඳහා වූ රජයේ වියදම් රුපියල් බිලියන 36.5 දක්වා සියයට 22.3 කින් වැඩි වූ අතර, 2011 මැයි මස සිට පොහොර සහනාධාරය සියලුම බෝග සඳහා ලබාදීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. ආබාධිත රණවිරුවන් වෙනුවෙන් වූ සුභසාධන වැඩසටහන් සඳහා වූ වියදම් 2012 වසරේ දී රුපියල් බිලියන 14.8 දක්වා සියයට 11 කින් වැඩි වූ අතර, 2012 අප්‍රේල් මස සිට සමෘද්ධි සහනාධාරය වැඩි කිරීමත් සමග සමෘද්ධි වැඩසටහන සඳහා වූ වියදම් රුපියල් බිලියන 10.6 දක්වා සියයට 16.7 කින් වැඩි විය. කෙසේ වෙතත්, ලෝක ආහාර වැඩසටහන යටතේ වූ පැවරුම් රුපියල් බිලියන 1.5 දක්වා සියයට 70 කින් සැලකිය යුතු ලෙස අඩු වූ අතර, ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල නැවත පදිංචි කිරීමේ කටයුතු අවසන් වීම මීට හේතු විය. මේ අතර, නොමිලේ පාසල් පෙළපොත් හා නිල ඇඳුම් ලබාදීම, පාසල් වාර ප්‍රවේශ පත්, නොමිලේ දහම් පාසල් පොත් ලබාදීම සහ පාසල් පෝෂණ වැඩසටහන වැනි පාසල් සිසුන් උදෙසා වූ වැඩසටහන් 2012 වසරේ රජය විසින් කුටුම්භ අංශය වෙත කරන ලද අනෙකුත් ප්‍රධාන පැවරුම් අතර විය.

**2012 වසරේ දී රාජ්‍ය ආයතන වෙත කරන ලද වර්තන පැවරුම් රුපියල් බිලියන 35.0 දක්වා සියයට 8.8 කින් වැඩි වූ අතර, රාජ්‍ය සංස්ථා වෙත කරන ලද වර්තන පැවරුම් රුපියල් බිලියන 11.8 දක්වා සියයට 9.1 කින් පහළ යන ලදී.** උසස් අධ්‍යාපනය සහ තෘතීය අධ්‍යාපනයට අදාළ ආයතන වෙත කරන ලද පැවරුම් ඉහළ යාම රාජ්‍ය ආයතන සඳහා වූ වර්තන පැවරුම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභවල සිදුවූ අඩුවීම රාජ්‍ය සංස්ථා වෙත කරන ලද වර්තන පැවරුම් අඩුවීමට හේතු විය. කෙසේ වෙතත් තැපැල් දෙපාර්තමේන්තුව (රුපියල් බිලියන 3.3), ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව (රුපියල් බිලියන 3.8), ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (රුපියල් බිලියන 4.0) යන ආයතනවල මෙහෙයුම් අලාභ පියවා ගැනීම සඳහා කරන ලද පැවරුම් 2012 වසරේ රාජ්‍ය සංස්ථා වෙත කරන ලද සමස්ත වර්තන පැවරුම්වලින් සියයට 94 ක් පමණ විය.

**ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ පැවති සියයට 6 සිට 2012 වසරේ දී සියයට 5.3 දක්වා අඩු විය.** රාජ්‍ය ආදායම අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු වීම හේතුවෙන් රජය උපාය මාර්ගිකව වැදගත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා සම්පත් යොමු කරන අතරතුර ප්‍රමුඛතාව අඩු ප්‍රාග්ධන වියදම් සීමාකිරීමට ක්‍රියාකරන ලදී. කෙසේ වෙතත්, නාමික වශයෙන්, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් 2012 වසරේ දී රුපියල් බිලියන 398.6 දක්වා සියයට 1.3 කින් වැඩි විය. එසේම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආයෝජන 2011 වසරේ වූ සියයට 6.2 ට සහ අයවැය මගින් අපේක්ෂා කළ සියයට 6.6 ට සාපේක්ෂව සියයට 5.5 දක්වා අඩු වූ අතර, නාමික වශයෙන් එය රුපියල් බිලියන 417.1 දක්වා සියයට 2.4 කින් වැඩි විය. ඒ අනුව, 2012 වසරේ රාජ්‍ය ආයෝජන 2012 අයවැය මගින් අපේක්ෂා කළ රුපියල් බිලියන 497.5 ට වඩා රුපියල් බිලියන 80.3 කින් අඩු විය. රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා දේශීය අරමුදල් උපයෝජනය කරන ලද අනුපාතිකය, ඒ සඳහා විදේශ අරමුදල් උපයෝජනය කරන ලද අනුපාතිකයට වඩා අඩු වූ අතර, මෙමගින් ආදායම් අඩු වීමෙන් ප්‍රාග්ධන වියදම් වලට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති වන බලපෑම පිළිබිඹු කරයි. ප්‍රාග්ධන වියදම් තුළ, රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සහ ස්ථාවර වත්කම් ඉදිකිරීම හා සංවර්ධනය සඳහා දරන ලද වියදම 2012 වසරේ දී රුපියල් බිලියන 170.5 දක්වා සියයට 15.9 කින් අඩු විය. කෙසේ වුවද, අදාළ කාලපරිච්ඡේදය තුළ දී කරන ලද ප්‍රාග්ධන පැවරුම් රුපියල් බිලියන 202.7 දක්වා සියයට 26.4 කින් වැඩි වූ අතර, ප්‍රාදේශීය සභා වෙත කරන ලද ප්‍රාග්ධන පැවරුම්වල සිදු වූ සියයට 8.5 ක අඩුවීම හමුවේ වුවද රාජ්‍ය ආයතන (සියයට 38.2 කින්) සහ රාජ්‍ය සංස්ථාවලට (සියයට 12.7) කරන ලද ප්‍රාග්ධන පැවරුම්වල ඉහළ යාම මෙයට හේතු විය. මේ අතර, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වැනි රජයේ වාණිජමය ආයතනවලට ලබාදෙන, විදේශ අරමුදල් මගින් ලද ණය ලබාදීමේ වැඩසටහන පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 44.9 ට සාපේක්ෂව 2012 වසරේ දී රුපියල් බිලියන 43.9 ක් විය.

**6.4 සංඛ්‍යා සටහන**

**කාර්යයන් අනුව වියදම් වර්ගීකරණය**

| ශීර්ෂය | 2011 | 2012 අනුමත ඇස්තමේන්තු | 2012 තාවකාලික | 2013 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|
| | රුපියල් මිලියන | | | |
| **වර්තන වියදම** | **1,006,633** | **1,107,902** | **1,094,248** | **1,267,390** |
| සාමාන්‍ය පොදු සේවා | 245,266 | 266,174 | 254,371 | 303,263 |
| සිවිල් පරිපාලනය | 43,076 | 49,646 | 47,135 | 55,414 |
| ආරක්ෂක කටයුතු | 159,553 | 164,785 | 163,219 | 198,997 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 42,637 | 51,743 | 44,017 | 48,852 |
| සමාජ සේවා | 314,137 | 357,383 | 335,991 | 408,387 |
| අධ්‍යාපනය | 99,043 | 107,988 | 107,271 | 121,189 |
| සෞඛ්‍යය | 74,443 | 82,153 | 81,946 | 95,016 |
| සුබසාධන | 123,122 | 146,912 | 128,451 | 166,724 |
| ප්‍රජාසේවා | 17,529 | 20,330 | 18,323 | 25,458 |
| ආර්ථික සේවා | 88,233 | 99,652 | 92,034 | 102,209 |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 46,290 | 51,471 | 46,429 | 55,023 |
| බලශක්ති සහ ජල සම්පාදන | 3,533 | 3,706 | 3,612 | 3,751 |
| ප්‍රවාහන සහ සන්නිවේදනය | 31,823 | 32,078 | 34,995 | 35,027 |
| වෙනත් | 6,587 | 12,398 | 6,998 | 8,408 |
| අනෙකුත් | 358,996 | 384,694 | 411,852 | 453,531 |
| එයින් පොලී ගෙවීම | 356,699 | 370,000 | 408,498 | 444,800 |
| **ප්‍රාග්ධන වියදම සහ ණය දීම්** | **407,489** | **497,465** | **417,130** | **529,250** |
| සාමාන්‍ය පොදු සේවා | 32,484 | 27,851 | 27,510 | 37,716 |
| සිවිල් පරිපාලනය | 28,668 | 26,795 | 26,565 | 35,603 |
| පොදු නීතිය හා ආරක්ෂාව | 3,816 | 1,057 | 945 | 2,113 |
| සමාජ සේවා | 62,953 | 92,500 | 70,570 | 95,228 |
| අධ්‍යාපනය | 22,326 | 33,307 | 28,930 | 42,461 |
| සෞඛ්‍යය | 14,774 | 27,878 | 17,053 | 23,363 |
| නිවාස | 6,712 | 10,896 | 7,319 | 7,383 |
| ප්‍රජා සේවා | 19,141 | 20,418 | 17,267 | 22,021 |
| ආර්ථික සේවා | 311,594 | 406,764 | 317,592 | 403,985 |
| කෘෂිකර්මය හා වාරිමාර්ග | 28,568 | 51,187 | 30,351 | 55,997 |
| බලශක්ති සහ ජල සම්පාදන | 74,028 | 89,962 | 76,192 | 75,142 |
| ප්‍රවාහන සහ සන්නිවේදනය | 186,342 | 237,539 | 190,030 | 225,282 |
| වෙනත් | 22,656 | 28,076 | 21,020 | 47,564 |
| අනෙකුත් | 459 | 585 | 1,459 | 921 |
| ඌණ වියදම් | - | -30,235 | - | -8,600 |
| **මුළු වියදම හා ණය දීම්** | **1,414,122** | **1,605,367** | **1,570,502** | **1,796,640** |
| | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | | | |
| සාමාන්‍ය පොදු සේවා | 4.2 | 3.9 | 3.7 | 3.9 |
| සමාජ සේවා | 5.8 | 6.0 | 5.4 | 5.8 |
| ආර්ථික සේවා | 6.1 | 6.7 | 5.4 | 5.8 |
| අනෙකුත් | 5.5 | 5.1 | 5.5 | 5.2 |
| එයින් පොලී ගෙවීම | 5.5 | 4.9 | 5.4 | 5.1 |
| **මුළු වියදම හා ණය දීම්** | **21.6** | **21.4** | **20.7** | **20.7** |

මූලය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

**ආර්ථික සේවාවන්වල සිදුකරන ආයෝජන රජයේ ආයෝජන වැඩසටහනේ ප්‍රමුඛතම අංශය ලෙස තවදුරටත් පැවති අතර, එය 2012 වසරේ දී රුපියල් බිලියන 317.6 ක් වශයෙන් පෙර වසරට සාපේක්ෂව සියයට 1.9 ක වර්ධනයක් පෙන්වීය.** ප්‍රමුඛ ජාතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වේගවත් කිරීමෙහිලා අත්කරගත් ප්‍රගතිය 2012 වසරේ දී ද අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. ඒ අනුව මහාමාර්ග, වරාය, විදුලිබල හා බලශක්ති, දුම්රිය මාර්ග සහ ජල සම්පාදනය හා වාරිමාර්ග යන අංශවල සැලකිය යුතු ආයෝජනයන් සිදු කරන ලදී. රටේ මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදීම රජයේ ප්‍රතිපත්තිය වන බැවින් දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ කටුනායක අධිවේගී මාර්ගය සහ කොළඹ පිටත වටරවුම් මාර්ගය වැනි ප්‍රවාහන ව්‍යාපෘතීන්හි සැලකිය යුතු ආයෝජනයක් 2012 වසරේ දී සිදු කරන ලදී. ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීමේ රජයේ ප්‍රතිපත්තිය හා සමගාමීව යමින් රටපුරා

දුම්රිය මාර්ග පද්ධතිය දීර්ඝ කිරීම සහ යථාතත්වයට පත්කිරීම සඳහා ආයෝජන සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකාව කලාපයේ නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමේ රජයේ දැක්ම පිළිබිඹු කරමින් කොළඹ දකුණු වරාය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් සැලකිය යුතු ආයෝජනයන් කරන ලදී. මේ අතර, ඉහළ කොත්මලේ ජල විදුලිබල ව්‍යාපෘතිය සහ වව්නියා කිලිනොච්චි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය 2012 වසරේ දී විදුලිබල හා බලශක්ති අංශයේ සිදු කළ ප්‍රමුඛ ආයෝජන විය. මීට අමතරව, ද්විතීයික නගර ප්‍රජාමූලික ජල සැපයුම් ව්‍යාපෘතිය හා ආවරණය නොවූ ප්‍රදේශ සඳහා ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය වැනි ව්‍යාපෘති හරහා ජල සම්පාදනය වැඩිදියුණු කිරීමට ආයෝජන සිදුකළ අතර, මොරගහකන්ද හා කළුගඟ ව්‍යාපෘතිය සහ උමාඔය හැරවුම ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘතිවල ද ආයෝජන සිදු කරන ලදී.

සමාජ සේවා සඳහා වූ රාජ්‍ය ආයෝජන 2012 වසරේ දී රුපියල් බිලියන 70.6 ක් දක්වා සියයට 12.1 කින් ඉහළ ගිය අතර, එයින් අධ්‍යාපනය සඳහා රුපියල් බිලියන 28.9 ක් ද සෞඛ්‍ය සඳහා රුපියල් බිලියන 17.1 ක් ද වෙන් විය. අධ්‍යාපනය සඳහා වූ රජයේ ආයෝජන ප්‍රාථමික හා ද්විතීක පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය, විශ්ව විද්‍යාල යටිතල පහසුකම් සංවර්ධනය සහ වෘත්තීය හා තාක්ෂණ අධ්‍යාපනය ඉහළ නැංවීම යන අංශ කෙරෙහි යොමු විය. මේ අතර, සෞඛ්‍ය අංශයේ වූ රජයේ ආයෝජන රෝහල් ඉදිකිරීම හා නවීකරණය, ජීව වෛද්‍ය උපකරණ හා රසායනාගාර උපකරණ සැපයීම සහ බෝවන හා බෝනොවන රෝග පාලනය කිරීම යන අංශ කෙරෙහි ප්‍රධාන වශයෙන් යොමු විය.

නාගරික හා ග්‍රාමීය අංශ අතර ඇති විශමතාවයන් අවම කිරීමේ අරමුණින් රජය ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්ම ක්‍රියාත්මක කිරීම වේගවත් කරන ලදී. ස්වයංපෝෂිත ගෘහ ආර්ථිකයක් ඇති කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වූ දිවිනැගුම වැඩසටහන සඳහා 2012 වසරේ දී රුපියල් බිලියන 2.9 ක් වැය කෙරිණි. මීට අමතරව, ගම නැගුම ව්‍යාපෘතිය සහ ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු අනෙකුත් ප්‍රජා සේවා සංවර්ධන වැඩසටහන් සඳහා අදාළ කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 29 ක් වැය කරන ලදී. තවද, සෑම පළාතකම ඇති අනන්‍යතාවය සහ ඒවායෙහි වූ විවිධ සම්පත් සහ විභවතාවයන් හඳුනාගනිමින් රටේ සෑම පළාතකම විශේෂිත පළාත් සංවර්ධන වැඩසටහන් ආරම්භ කරන ලදී.

**6.5 රූප සටහන — අයවැය හිඟය මූල්‍යනය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




## අයවැය හිඟය මූල්‍යනය කිරීම

2012 වසරේ රුපියල් බිලියන 489 ක් වූ සමස්ත අයවැය හිඟය ප්‍රධාන වශයෙන්ම විදේශීය මූලාශ්‍ර මගින් මූල්‍යයනය කරන ලදී. ඒ අනුව, සමස්ත මූල්‍යන අවශ්‍යතාවයෙන් විදේශීය මූලාශ්‍රවලින් ලැබුණු දායකත්වය 2011 වසරේ පැවති සියයට 49 ට සහ 2012 අයවැය මගින් ඉලක්කගත අගය වන සියයට 42 ට සාපේක්ෂව 2012 වසරේ සියයට 59 ක් වූ අතර, ඉතිරිය දේශීය මූලාශ්‍රවලින් මූල්‍යනය කරන ලදී. ඒ අනුව, ශුද්ධ විදේශීය මූල්‍යනය අයවැය මගින් ඇස්තමේන්තුගත රුපියල් බිලියන 197.3 සමග සසඳා බැලීමේ දී රුපියල් බිලියන 286.5 ක් වූ අතර, ශුද්ධ දේශීය මූල්‍යනය අයවැය

**6.5 සංඛ්‍යා සටහන — දේශීය ණයගැනීමේ මූලාශ්‍ර**

රුපියල් බිලියන

| ශීර්ෂය | 2009 | 2010 | 2011 | 2012 තාවකාලික |
|---|---|---|---|---|
| **ණය උපකරණ අනුව** | **245.6** | **202.2** | **231.2** | **200.4** |
| භාණ්ඩාගාර බැඳුම්කර (අ) | 201.9 | 140.4 | 168.4 | 154.5 |
| භාණ්ඩාගාර බිල්පත් (ආ) | 49.0 | 82.8 | 79.6 | 16.8 |
| රුපියල් ණය | -17.7 | -24.6 | -25.7 | -3.6 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 7.6 | 11.1 | 5.3 | 18.4 |
| මහ බැංකු තාවකාලික අත්තිකාරම් | -2.4 | 4.0 | 16.9 | 16.5 |
| අනෙකුත් | 7.1 | -11.5 | -13.2 | -2.2 |
| **ආයතන අනුව** | **245.6** | **202.2** | **231.2** | **200.4** |
| බැංකු | 49.0 | -1.9 | 191.9 | 131.5 |
| බැංකු නොවන | 196.5 | 204.1 | 39.4 | 68.9 |

මූලයන් : මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) විදේශීය ආයෝජකයින් වෙත නිකුත් කරන ලද සහ විදේශියන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් හා විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට 2009 සිට නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා ඛණිජ තෙල් සංස්ථාව වෙත නිකුත් කරන ලද රජයේ සුරැකුම්පත් වල වටිනාකම් ඇතුළත් නොවේ.

(ආ) විදේශීය ආයෝජකයින් සහ විදේශියන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් හා විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට 2009 සිට නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් වටිනාකම් ඇතුළත් නොවේ.

**6.6 රූප සටහන** **බැංකු ණය මූලාශ්‍ර**




මගින් ඇස්තමේන්තුගත රුපියල් බිලියන 271.6 සමග සසඳා බැලීමේ දී රුපියල් බිලියන 202.5 ක් විය.

**2012 වසරෙහි ශුද්ධ දේශීය මූල්‍යනයෙහි සංයුතිය සළකා බැලීමේ දී රජය බැංකු මූලාශ්‍රයන් වෙත වැඩි වශයෙන් නැඹුරු විය.** 2012 වසරෙහි බැංකු අංශයෙන් වූ ශුද්ධ මූල්‍යනය අයවැය මගින් ඇස්තමේන්තුගත රුපියල් බිලියන 64 සමග සසඳා බැලීමේ දී රුපියල් බිලියන 131.5 ක සැලකිය යුතු ඉහළ අගයක් විය. කෙසේ වුවද, ශුද්ධ දේශීය මූල්‍යනයට බැංකු අංශයෙන් සිදු කළ දායකත්වය 2011 වසරෙහි පැවති සියයට 83 සිට සියයට 65 දක්වා අඩු විය. 2012 වසරෙහි අප්‍රේල් මාසය වන විට රුපියල් බිලියන 88.9 දක්වා වැඩි වූ මහ බැංකුව වෙතින් සිදුකළ ශුද්ධ මූල්‍යනය වසර අවසානය වන විට රුපියල් බිලියන 16.1 දක්වා අඩු වූ අතර, එමගින් දෙසැම්බර් මාසයේ දී මහ බැංකුව සතුව පැවති භාණ්ඩාගාර බිල්පත් ශීඝ්‍ර ලෙස අඩුවීම පිළිබිඹු විය. මීට අමතරව, මහ බැංකු තාවකාලික අත්තිකාරම් රුපියල් බිලියන 16.5 ක් විය. ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු සතුව පැවති භාණ්ඩාගාර බිල්පත් වැඩිවීම සහ රාජ්‍ය බැංකු දෙකෙහි ඇති රජයේ බැකු අයිරා ඉහළ යාම හේතුවෙන් වාණිජ බැංකුවලින් ණය ගැනීම් රුපියල් බිලියන 115.4 කින් වැඩි විය. ඒ අනුව, බැංකු නොවන අංශයෙන් ණය ගැනීම් අයවැයෙන් අපේක්ෂිත රුපියල් බිලියන 207.6 ට සාපේක්ෂව රුපියල් බිලියන 71 ක් විය. කෙසේ වුවද, සමස්ත දේශීය මූල්‍යනයෙන් බැංකු නොවන අංශයෙන් ණය ගැනීම් 2011 වසරෙහි පැවති සියයට 19 සිට 2012 වසරෙහි සියයට 35 දක්වා වැඩි විය. පෙර වසරවල දී මෙන්ම සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව තවදුරටත් බැංකු නොවන අංශයෙහි ප්‍රධාන ආයතනික ආයෝජකයන් විය.

**රාජ්‍ය ණය කළඹෙහි ඇති අවදානම අඩු කරන අතරතුර, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ වැඩිදියුණු කිරීමේ මැදිකාලීන රාජ්‍ය ණය කළමනාකරණ උපායමාර්ගවලට සමගාමීව, 2012 වසරෙහි අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා දිගු පරිණත කාලයක් සහිත ගනුදෙනු කළහැකි ණය උපකරණ මත රජය වැඩි වශයෙන් රඳා පැවතුණි.** ඒ අනුව, ණය උපකරණ මගින් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 186.1 ක් වූ අතර එය භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 154.5, භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 16.8 සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රුපියල් බිලියන 18.4 කින් මෙන්ම රුපියල් ණය සුරැකුම්පත් ආපසු ගෙවීම් රුපියල් බිලියන 3.6 කින් සමන්විත විය. අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය 2011 වසරෙහි පැවති රුපියල් බිලියන 3.7 සිට රුපියල් බිලියන 14.3 දක්වා වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ රාජ්‍ය බැංකු දෙකෙන් බැංකු අයිරා පහසුකම යටතේ ලබාගත් ණය 2011 වසරෙහි වාර්තා වූ සුළු අඩුවීමට සාපේක්ෂව රුපියල් බිලියන 46.7 දක්වා විශාල ලෙස වැඩිවීමයි. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා අධික ඉල්ලුමක් පිළිබිඹු කරමින් විදේශ ව්‍යවහාර මුදලින් වටිනාකම තක්සේරු කරන ලද දේශීය ණය ගැනීම් රුපියල් බිලියන 18.4 කින් තවදුරටත් වැඩිවිය.

**දේශීය වෙළෙඳපොළ මත පීඩනය අවම කරමින් 2012 වසරෙහි අයවැය පරතරය මූල්‍යනය කිරීමේ දී ශුද්ධ විදේශීය මූල්‍යනය අයවැයෙන් අපේක්ෂා කළ මට්ටම ඉක්මවීය.** ඒ අනුව, වසර තුළ විදේශීය මූලාශ්‍රයන්ගෙන් ලබාගත් මුළු දළ විදේශ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් බිලියන 487 ක් වූ අතර, මුළු ශුද්ධ විදේශ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් බිලියන 286.5 ක් විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද අරමුදල්, රුපියල් වලින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත්වල විදේශීය ආයෝජනය සැලකිය යුතු ලෙස වැඩිවීම සහ අයවැයෙන් අපේක්ෂිත පරිදි ව්‍යාපෘති ණය ලැබීම් වැඩිවීම 2012 වසර තුළ විදේශ මූල්‍යනය ඉහළ යාමට දායක විය. 2007 වසරෙහි නිකුත් කරන ලද පළමු ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව පියවීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 500 ක් යොදාගත් බැවින් ශුද්ධ වශයෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 66.2 (එ.ජ.ඩොලර් මිලියන 500) ක් විය. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කරන ලද විදේශීය ආයෝජනවලින් ලද ශුද්ධ මූල්‍යනය පිළිවෙළින් රුපියල් බිලියන 99.7 ක් සහ රුපියල් බිලියන 6 ක් විය. ඒ අනුව, ප්‍රධාන වශයෙන් ආයෝජකයන්ගේ විශ්වාසය වැඩිවීම සහ විදේශ ආයෝජකයන් සඳහා පැවති ආයෝජන සීමාව 2011 දෙසැම්බර් මාසයේ දී පැවති නොපියා වූ ණය ප්‍රමාණයෙන් සියයට 10 සිට සියයට 12.5 දක්වා වැඩි කිරීම හේතුවෙන් 2012 වසරේ

**6.7 රූප සටහන** **නොපියවූ රාජ්‍ය ණය**




රජයේ සුරැකුම්පත්වල විදේශීය ආයෝජන 2011 වසරට සාපේක්ෂව තුන් ගුණයක් තරම් විශාල ප්‍රමාණයකින් වැඩි විය. ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන්ගෙන් ලද ව්‍යාපෘති ණය රුපියල් බිලියන 233.9 ක් විය. ඒ අනුව, මුළු ශුද්ධ විදේශ මූල්‍යනයෙන් සියයට 60 ක් විදේශීය වාණිජ මූලාශ්‍රවලින් මූල්‍යනය කෙරුණු අතර, ඉතිරිය වාණිජ නොවන ණය මූලාශ්‍රවලින් මූල්‍යනය කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුව (ADB), චීනය සහ ජපානය වාණිජ නොවන ණය ලබාදුන් ප්‍රධාන මූලාශ්‍රයන් විය.

## 6.4 රාජ්‍ය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

### රාජ්‍ය ණය

මෑත කාලය පුරා පැවති ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස නොපියවූ රාජ්‍ය ණයෙහි අඩුවීමේ ප්‍රවණතාවය ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව අවප්‍රමාණය වීම මත මුළු ණය ප්‍රමාණයෙහි වැඩිවීම මූලික කොට ගෙන ආපසු හැරවුණි. 2012 වසර අවසානයේ රාජ්‍ය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරෙහි වාර්තා වූ සියයට 78.5 ට සහ මැදිකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවෙහි පුරෝකථනය කළ සියයට 77.7 ට සාපේක්ෂව සියයට 79.1 දක්වා වැඩි විය. නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය 2011 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 5,133.4 සිට 2012 වසර අවසානයේ දී රුපියල් බිලියන 6,000.1 දක්වා සියයට 16.9 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. ශුද්ධ මූල්‍යනයේ වැඩිවීම, වට්ටම් අනුපාතය සහ ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව අවප්‍රමාණය වීම මෙම වැඩිවීම සඳහා දායක විය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ණය ප්‍රමාණය සියයට 42.6 ක් සහ විදේශීය ණය ප්‍රමාණය සියයට 36.5 ක් වූ අතර, පෙර වසරෙහි මෙම අනුපාත පිළිවෙළින් සියයට 42.9 ක් සහ සියයට 35.6 ක් විය.

**දේශීය ණය ප්‍රමාණය මුළු ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස 2011 වසරෙහි පැවති සියයට 54.6 සිට 2012 දී සියයට 53.9 දක්වා සුළු වශයෙන් අඩු විය.** දේශීය මූලාශ්‍ර මගින් ණය ගැනීම් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. දේශීය ණය ප්‍රමාණයෙහි වූ මධ්‍යකාලීන හා දිගුකාලීන ණය ප්‍රමාණය පෙර වසරෙහි පැවති සියයට 75.1 සිට 2012 වසරේ දී සියයට 74.8 දක්වා සුළු වශයෙන් අඩු විය. මධ්‍යකාලීන සහ දිගුකාලීන ණය ප්‍රමාණයෙන් බහුතරයක් (සියයට 86.6) භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත වූ අතර ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ රුපියල් ණය පිළිවෙළින් සියයට 9.2 සහ සියයට 2.4 ක් විය. කෙටිකාලීන දේශීය ණයවලින් භාණ්ඩාගාර බිල්පත් ණය ප්‍රමාණය 2011 වසර අවසානයේ පැවති සියයට 84.6 සිට 2012 වසර අවසානයේ දී සියයට 77.4 දක්වා අඩු වූ අතර මහ බැංකුවෙන් ලබාගන්නා තාවකාලික අත්තිකාරම් සහ බැංකු අංශයේ

**6.6 සංඛ්‍යා සටහන** **රජයේ නොපියවූ ණය (වසර අවසානයට)**

රුපියල් මිලියන

| ශීර්ෂය | 2009 | 2010 | 2011 | 2012 තාවකාලික |
|---|---|---|---|---|
| **මුළු රාජ්‍ය ණය** | **4,161,422** | **4,590,245** | **5,133,365** | **6,000,112** |
| **දේශීය ණය (අ)** | **2,400,955** | **2,565,662** | **2,804,085** | **3,232,813** |
| පරිණත කාලය අනුව | | | | |
| කෙටි කාලීන | 560,646 | 619,549 | 698,190 | 813,272 |
| මැදි හා දිගු කාලීන | 1,840,309 | 1,946,113 | 2,105,895 | 2,419,541 |
| ආයතන අනුව | | | | |
| බැංකු (ආ) | 705,765 | 691,716 | 886,221 | 1,058,366 |
| බැංකු නොවන | 1,695,089 | 1,873,845 | 1,917,864 | 2,174,447 |
| **විදේශීය ණය** | **1,760,467** | **2,024,583** | **2,329,280** | **2,767,299** |
| ණය වර්ගය අනුව | | | | |
| සහනදායී ණය | 1,271,142 | 1,266,910 | 1,328,797 | 1,369,568 |
| සහනදායී නොවන ණය | 78,649 | 147,241 | 235,923 | 455,069 |
| වාණිජ ණය | 410,677 | 610,433 | 764,560 | 942,662 |
| ව්‍යවහාර මුදල් අනුව | | | | |
| වි.ගැ.හි. | 567,502 | 572,354 | 601,691 | 682,065 |
| එ.ජ. ඩොලර් | 330,842 | 476,490 | 678,983 | 853,832 |
| ජපාන යෙන් | 452,758 | 508,802 | 560,456 | 575,196 |
| යූරෝ | 143,566 | 142,371 | 146,711 | 174,563 |
| වෙනත් | 265,799 | 324,566 | 341,439 | 481,643 |
| සටහන: | | | | |
| විනිමය අනුපාතයේ විචලනය | 23,114 | -4,653 | 85,573 | 207,389 |

මූලයන්: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2003 නොවැම්බර් මස ස.තො.ස වෙනුවෙන් වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද රුපියල් මිලියන 4,397 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර, 2012 ජනවාරි මස ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද රුපියල් මිලියන 78,447ක රජයේ බැඳුම්කර, 2007 සිට විදේශිකයන් විසින් රුපියල් වටිනාකමින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර වල කළ ආයෝජන සහ 2009 සිට විදේශියන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් හා ශ්‍රී ලාංකීක ශ්‍රමිකයන් භාණ්ඩාගාර බැඳුම්කර වල කළ ආයෝජන ඇතුළත් නොවේ.

(ආ) අක්වෙරළ බැංකු ඒකකයන්ගෙන් (OBUs) ලබා ගත් නොපියවූ ණය ඇතුළත්වේ.

**6.8 රූප සටහන** **නොපියවූ රාජ්‍ය දේශීය ණය සංයුතිය - 2012**




**6.9 රූප සටහන** **නොපියවූ රාජ්‍ය විදේශීය ණය සංයුතිය - 2012**




අනෙකුත් (බැංකු තැන්පතු හැර) වගකීම් කෙටිකාලීන දේශීය ණයවල ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 13.7 සහ සියයට 6.6 ක් විය.

**2012 වසර අවසානයේ බැංකු නොවන අංශය වෙත පැවති නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 2,174.3 දක්වා සියයට 13.4 කින් වැඩි වූ අතර, එය මුළු දේශීය ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක්, ලෙස 2011 වසර අවසානයේ පැවති සියයට 68.4 සිට සියයට 67.3 දක්වා සුළු වශයෙන් අඩු විය.** බැංකු නොවන අංශයෙන් භාණ්ඩාගාර බිල්පත් මගින් ලබාගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 255.3 දක්වා සියයට 8.5 කින් වැඩි වූ අතර, භාණ්ඩාගාර බිල්පත් මුළු බැංකු නොවන අංශය වෙත පැවති ණයෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරෙහි පැවති සියයට 12.3 සිට 2012 වසරේ දී සියයට 11.7 දක්වා අඩු විය. තවද, බැංකු නොවන අංශය වෙතැති භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 1,852.2 දක්වා සියයට 14.9 කින් වැඩි වූ අතර, එහි සාපේක්ෂ කොටස පෙර වසර අවසානයේ පැවති සියයට 84.1 සිට 2012 වසර අවසානයේ දී සියයට 85.2 දක්වා වැඩිවිය. සේවක අර්ථසාධක අරමුදල (සියයට 54.0) සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව (සියයට 15.2) තවදුරටත් බැංකු නොවන අංශය සතු රාජ්‍ය ණය ප්‍රමාණයේ ප්‍රධාන ආයෝජකයන් විය.

**දේශීය බැංකු පද්ධතිය වෙත වූ නොපිය වූ රාජ්‍ය ණය ප්‍රමාණය 2012 වසර අවසානයේ රුපියල් බිලියන 1,058.4 දක්වා සියයට 19.4 කින් වැඩි විය.** 2012 වසර අවසානයේ මහ බැංකුව වෙත වූ නොපිය වූ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 265.2 දක්වා සියයට

**6.7 සංඛ්‍යා සටහන** **ශ්‍රී ලංකාවේ විදේශීය ණය අවදානම තක්සේරු කිරීම - 2012**

| දර්ශකය | ආසියා හා පැසිපික් කාලපීය ඒ.ජා.ගේ ආර්ථික හා සාමාජීය කොමිසම (UN-ESCAP) විසින් නිර්වචනය කර ඇති අවධි අගයන් | | | ශ්‍රී ලංකාව 2012 තාවකාලික |
|---|---|---|---|---|
| | පහළ ණය ගැති බව | මධ්‍යස්ථ ණය ගැති බව | ඉහළ ණය ගැති බව | |
| නොපියවූ මුළු විදේශීය ණය/දළ ජාතික ආදායම | <30% | >30% සහ <50% | >50% | 37.2% |
| නොපියවූ මුළු විදේශීය ණය/භාණ්ඩ අපනයන සහ සේවක වන්දි හා සේවක ප්‍රේෂණ ඇතුලත් සාධක නොවන සේවා | <165% | >165% සහ <275% | >275% | 111.0% |
| මුළු විදේශ ණය සේවාකරණය/භාණ්ඩ අපනයන සහ සේවක වන්දි හා සේවක ප්‍රේෂණ ඇතුලත් සාධක නොවන සේවා | <18% | >18% සහ <30% | >30% | 11.4% |
| විදේශ ණය පොලී සේවාකරණය/භාණ්ඩ අපනයන සහ සේවක වන්දි හා සේවක ප්‍රේෂණ ඇතුලත් සාධක නොවන සේවා | <12% | >12% සහ <20% | >20% | 3.6% |
| නොපියවූ ණයෙහි ශුද්ධ වර්තමාන අගය/දළ ජාතික ආදායම (අ) | <48% | >48% සහ <80% | >80% | 40.4% |
| නොපියවූ ණයෙහි ශුද්ධ වර්තමාන අගය/භාණ්ඩ අපනයන සහ සේවක වන්දි හා සේවක ප්‍රේෂණ ඇතුලත් සාධක නොවන සේවා (අ) | <132% | >132% සහ <220% | >220% | 129.9% |

(අ) පසු ගිය වසර දෙක සහ පවතින වසරෙහි සාමාන්‍යය

මූලයන්: එළදායී ණය කළමණාකරණය පිළිබඳ අත්පොත, UN-ESCAP, ශ්‍රී ලංකා මහ බැංකුව

**6.10 රූප සටහන** **ව්‍යවහාර මුදල් වර්ගය අනුව සමස්ත නොපියවූ ණය සංයුතිය - 2012**




0.7 කින් සුළු වශයෙන් වැඩි වූ අතර, දේශීය බැංකු අංශය වෙත වූ ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස එය පෙර වසර අවසානයේ පැවති සියයට 29.7 සිට සියයට 25.1 දක්වා අඩු විය. 2012 වසරෙහි මහ බැංකුව සතු වූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් භාණ්ඩාගාර බිල්පත් වලින් (සියයට 58.1) සමන්විත වූ අතර, ඉතිරිය මහ බැංකු තාවකාලික අත්තිකාරම් වලින් සමන්විත විය. රජයේ බැංකු අයිරා (සියයට 92.9 කින්), ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (සියයට 21.3 කින්), භාණ්ඩාගාර බිල්පත් (සියයට 18.3 කින්) සහ භාණ්ඩාගාර බැඳුම්කර (සියයට 17.6 කින්) ඉහළ යෑමෙන් වාණිජ බැංකු සතු මුළු නොපිය වූ ණය ප්‍රමාණය 2011 වසරට සාපේක්ෂව 2012 වසර අවසානයේ දී රුපියල් බිලියන 793.2 දක්වා සියයට 27.3 කින් වැඩිවිය.

**විදේශ ව්‍යවහාර මුදලින් වටිනාකම තක්සේරු කරන ලද දේශීය ණය ප්‍රමාණය 2011 වසර අවසානයේ දී පැවති රුපියල් බිලියන 201 (එ.ජ.ඩොලර් මිලියන 1,764) සිට 2012 වසර අවසානයේ දී රුපියල් බිලියන 242.1 (එ.ජ.ඩොලර් මිලියන 1,904) දක්වා වැඩි විය.** මෙය ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රුපියල් බිලියන 39.2 කින් ඉහළ යාමේ සහ එ.ජ.ඩොලර් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. විදේශ ව්‍යවහාර මුදලින් වටිනාකම තක්සේරු කරන ලද දේශීය ණය, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රුපියල් බිලියන 223 (එ.ජ.ඩොලර් මිලියන 1,754) කින් සහ අක්වෙරළ බැංකු ඒකක මගින් ලබාගත් නොපිය වූ ණය රුපියල් බිලියන 19.1 (එ.ජ.ඩොලර් මිලියන 150) කින් සමන්විත විය.

**ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත නොපියවූ විදේශ ණය ප්‍රමාණය, 2011 වසර අවසානයේ පැවති සියයට 35.6 සිට 2012 වසර අවසානයේ දී සියයට 36.5 ක් දක්වා වැඩි වූ අතර, එය නාමික වටිනාකම අනුව රුපියල් බිලියන 2,767 ක් දක්වා සියයට 18.8 කින් ඉහළ යන ලදී.** අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා විදේශීය මූලාශ්‍රයන් ගෙන් ලද ඉහළ දායකත්වය සහ වසර තුළදී ප්‍රධාන වශයෙන් විදේශ ව්‍යවහාර මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම විදේශ ණය ප්‍රමාණය ඉහළයාමට වැඩි වශයෙන් හේතු විය. සහනදායී නොවන ණය ප්‍රමාණය සමස්ත විදේශ ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 2011 වසර අවසානයේ පැවති සියයට 43 සිට 2012 වසර අවසානයේ දී සියයට 50.5 දක්වා ඉහළ යමින් සහනදායී නොවන ණය රුපියල් බිලියන 1,397.7 ක් දක්වා සියයට 39.7 කින් වැඩිවිය. ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල විදේශීය ආයෝජන සැලකිය යුතුලෙස වැඩිවීම සහ පස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව හේතුවෙන් වාණිජ ණය රුපියල් බිලියන 942.7 දක්වා සියයට 23.3 කින් වැඩි විය.

**ප්‍රධාන විදේශ විනිමය වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් 2012 වසර අගදී සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 207.4 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.7) කින් විශාල ලෙස වැඩි විය.** ශ්‍රී ලංකා රුපියල යූරෝවලට සාපේක්ෂව සියයට 12.6 කින්, වි.ගැ.හි. වලට සාපේක්ෂව සියයට 10.5 කින්, එ.ජ.ඩොලර් වලට සාපේක්ෂව සියයට 10.4 කින්, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 7.6 කින් සහ ජපාන යෙන් වලට සාපේක්ෂව සියයට 0.6 කින් අවප්‍රමාණය විය. තවද, සමස්ත නොපිය වූ විදේශ ණය ප්‍රමාණය, එ.ජ.ඩොලර් (සියයට 30.9), වි.ගැ.හි. (සියයට 24.6), ජපාන යෙන් (සියයට 20.8), යූරෝ (සියයට 6.3), ශ්‍රී ලංකා රුපියල් (සියයට 14.6) සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වර්ග (සියයට 2.8) කින් සමන්විත විය. එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් එ.ජ.ඩොලර් වලින් වටිනාකම නාමනය කරන ලද දේශීය ණය (ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ අක්වෙරළ බැංකු ඒකක වලින් ලබාගත් ණය) රුපියල් බිලියන 22.8 කින් ඉහළ යන ලදී.

**රටක විදේශීය ණය අවදානම තක්සේරු කිරීමට ආසියා හා පැසිෆික් කලාපීය එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජීය කොමිසමෙහි ඵලදායී ණය කළමනාකරණය පිළිබඳ අත්පොතේ අවදි අගයන්ගේ නිර්වචනයන්ට අනුව ශ්‍රී ලංකාව ණය ගැති බවින් අඩු රටක් ලෙස වර්ගීකරණය කළ හැකිය.** 2012 වසරේ විදේශීය ණය දර්ශක 6 න් 5 ක් ම ශ්‍රී ලංකාව ණය ගැති බවින් අඩු රටක් ලෙස සනාථ කරන බව විශ්ලේෂණය මගින් පෙන්වා දෙයි. දළ ජාතික ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණය, ශ්‍රී ලංකාව මධ්‍යස්ථ ණය ගැති බව සහිත රටක් ලෙස වර්ගීකරණය

**6.11 රූප සටහන** රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)




කළ එකම දර්ශකය වන අතර, ශ්‍රී ලංකාව සඳහා සියයට 37.2 ක් වූ එම අගය පහළ ණය ගැති බව සනාථ කරන දර්ශක අගය වන සියයට 35 ට වඩා සුළු වැඩිවීමකි. මේ අනුව, ගෝලීය ආර්ථිකයේ පසුබෑමත් සමග බොහෝ රටවල රාජ්‍ය ණය අවදානමට ලක්ව ඇති විටෙක මෙවැනි ණය දර්ශක අගයන් වාර්තා කිරීමට ශ්‍රී ලංකාවට හැකිවීම අවධානයට ලක්විය යුතු කරුණකි.

### ණය සේවාකරණ ගෙවීම්

විශේෂයෙන්ම 2012 ප්‍රථම කාල පරිච්ඡේදයේ දී දේශීය පොලී අනුපාතයන්ගේ වැඩිවීම සහ ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් සමස්ත ණය සේවාකරණ ගෙවීම් 2011 වසරේ පැවති රුපියල් බිලියන 895.4 සහ අයවැය ඇස්තමේන්තුවේ පුරෝකථනය කළ රුපියල් බිලියන 940 ට සාපේක්ෂව 2012 වසරේ දී රුපියල් බිලියන 1,017.5 දක්වා විශාල ලෙස වැඩි විය. මෙහිදී ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 609 ක් දක්වා රුපියල්

**6.8 සංඛ්‍යා සටහන** රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම්

රුපියල් මිලියන

| ශීර්ෂය | 2009 | 2020 | 2011 | 2012 තාවකාලික |
|---|---|---|---|---|
| **ණය සේවාකරණ ගෙවීම්** | **825,687** | **820,448** | **895,382** | **1,017,468** |
| දේශීය | 675,274 | 686,800 | 728,028 | 733,100 |
| විදේශීය | 150,414 | 133,648 | 167,354 | 284,368 |
| **ණය ආපසු ගෙවීම්** | **516,012** | **467,856** | **538,683** | **608,970** |
| දේශීය | 401,296 | 389,672 | 439,894 | 415,441 |
| විදේශීය | 114,716 | 78,184 | 98,789 | 193,529 |
| **පොලී ගෙවීම්** | **309,675** | **352,592** | **356,699** | **408,498** |
| දේශීය | 273,978 | 297,127 | 288,134 | 317,659 |
| කෙටිකාලීන | 72,364 | 58,943 | 46,257 | 65,049 |
| මැදි හා දිගුකාලීන | 201,613 | 238,185 | 241,877 | 252,610 |
| විදේශීය | 35,698 | 55,464 | 68,565 | 90,839 |

මූලයන්: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

**6.9 සංඛ්‍යා සටහන** රාජ්‍ය ණය දර්ශක

| දර්ශකය | 2009 | 2010 | 2011 | 2012 තාවකාලික |
|---|---|---|---|---|
| රාජ්‍ය ණය/ද.දේ.නි. | 86.2 | 81.9 | 78.5 | 79.1 |
| දේශීය ණය/ද.දේ.නි. | 49.7 | 45.8 | 42.9 | 42.6 |
| විදේශීය ණය/ද.දේ.නි. | 36.5 | 36.1 | 35.6 | 36.5 |
| මුළු විදේශීය ණය/අපනයන (අ) | 170.7 | 161.4 | 154.4 | 160.0 |
| මුළු ණය සේවාකරණ ගෙවීම්/ද.දේ.නි | 17.1 | 14.6 | 13.7 | 13.4 |
| මුළු ණය සේවාකරණ ගෙවීම්/ රජයේ ආදායම (ආ) | 118.0 | 100.4 | 95.8 | 103.0 |
| එයින් දේශීය ණය සේවාකරණ ගෙවීම්/රජයේ ආදායම (ආ) | 96.5 | 84.0 | 77.9 | 74.2 |
| මුළු ණය සේවාකරණ ගෙවීම්/ රජයේ වියදම (ඇ) | 48.1 | 46.9 | 46.2 | 48.4 |
| එයින් දේශීය ණය සේවාකරණ ගෙවීම්/රජයේ වියදම (ඇ) | 39.3 | 39.3 | 37.6 | 34.9 |
| විදේශීය ණය සේවාකරණ ගෙවීම්/ අපනයන (අ) | 14.6 | 10.7 | 11.1 | 16.4 |
| මුළු ණය පොලී ගෙවීම්/ද.දේ.නි. | 6.4 | 6.3 | 5.5 | 5.4 |
| දේශීය ණය පොලී ගෙවීම්/ද.දේ.නි. | 5.3 | 5.3 | 4.4 | 4.2 |
| දේශීය ණය පොලී ගෙවීම්/ රජයේ වර්තන වියදම් | 31.1 | 31.7 | 28.6 | 29.0 |
| විදේශීය ණය පොලී ගෙවීම්/අපනයන (අ) | 3.5 | 4.4 | 4.5 | 5.3 |

මූලයන්: මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) භාණ්ඩ හා සේවා අපනයන
(ආ) රජයේ ආදායම ආර්ථික වර්ගීකරණයට අනුව
(ඇ) ණය ආපසු ගෙවීම් ඇතුළත්ව රජයේ වියදම

බිලියන 70.3 කින් වැඩි වී සමස්ත ණය සේවාකරණ ගෙවීම් වලින් සියයට 59.9 ක් වූ අතර පොලී ආපසු ගෙවීම් රුපියල් බිලියන 408.5 දක්වා රුපියල් බිලියන 51.8 කින් වැඩිවී සමස්ත ණය සේවාකරණ ගෙවීම් වල ඉතිරි කොටසට දායක විය. දේශීය මූලාශ්‍ර වෙත කෙරෙන ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 733.1 ක් දක්වා 2011 වසරට වඩා රුපියල් බිලියන 5.1 කින් වැඩි විය. මෙය, පෙර වසරට සාපේක්ෂව ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 415.4 දක්වා රුපියල් බිලියන 24.5 කින් පහළ යාමෙහි සහ ණය පොලී ගෙවීම් රුපියල් බිලියන 317.7 දක්වා රුපියල් බිලියන 29.5 කින් ඉහළ යාමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. විදේශ ණය සේවාකරණ ගෙවීම් සම්බන්ධව සලකා බැලීමේ දී 2011 වසරට සාපේක්ෂව විදේශ ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 193.5 දක්වා රුපියල් බිලියන 94.7 කින් වැඩි වූ අතර විදේශ පොලී ගෙවීම් ද රුපියල් බිලියන 90.8 දක්වා රුපියල් බිලියන 22.3 කින් වැඩි විය.

2012 වසරේ දී ණය සේවාකරණ දර්ශක මිශ්‍ර ප්‍රතිඵලයන් පෙන්නුම් කරන ලදී. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ණය සේවාකරණ ගෙවීම් අනුපාතය 2011 වසරෙහි පැවති සියයට 13.7 සිට 2012 වසරේ දී සියයට 13.4 දක්වා සුළු වශයෙන් වර්ධනය වූ අතර

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත පොලී ගෙවීම් අනුපාතයද 2011 වසරෙහි පැවති සියයට 5.5 සිට 2012 වසරේ දී සියයට 5.4 දක්වා සුළු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. තව දුරටත්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය පොලී ගෙවීම් අනුපාතය ද 2011 වසරේ පැවති සියයට 4.4 සිට 2012 වසරේ දී සියයට 4.2 දක්වා අඩු විය. කෙසේ වුවද, රාජ්‍ය ආදායම් වල සුළු වැඩිවීමට (2011 වසරට වඩා සියයට 5.7) සාපේක්ෂව ණය සේවාකරණ ගෙවීම් සියයට 13.6 කින් වැඩිවීම හේතුවෙන් රාජ්‍ය ආදායමට සාපේක්ෂව ණය සේවාකරණ ගෙවීම් අනුපාතය 2011 වසරෙහි පැවති සියයට 95.8 සිට 2012 වසරේ දී සියයට 103 දක්වා වැඩිවිය.

## 6.5 උප රාජ්‍ය ආයතනවල අයවැය කටයුතු

### උප රාජ්‍ය ආයතනවල ප්‍රතිපත්ති දිශාව හා ක්‍රියාමාර්ග

**ශ්‍රී ලංකාවේ උප රාජ්‍ය ආයතන පද්ධතිය පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලින් සමන්විත වේ.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනය යටතේ පළාත් සභා 9 ක් පිහිටුවා ඇති අතර 2011 වසරේ දී නව පළාත් පාලන ආයතන පහක් පිහිටුවීමත් සමග පළාත් පාලන ආයතන පද්ධතිය ආයතන 335 කින් සමන්විත විය. 2012 වසර අවසානය වන විට පළාත් පාලන ආයතන පද්ධතිය මහ නගර සභා 23 කින්, නගර සභා 41 කින් සහ ප්‍රාදේශීය සභා 271 කින් සමන්විත විය.

**2012 වසරේ දී පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් උප රාජ්‍ය මට්ටමේ යහපාලනය ශක්තිමත් කිරීම සහ යටිතල පහසුකම් සමග ආර්ථිකය නගා සිටුවීම මගින් රටේ සාධාරණ හා තිරසාර වර්ධනයක් ඇති කිරීම කෙරෙහි යොමු විය.** වත්මන් ආර්ථික ව්‍යුහය හා සමගාමීව, උප රාජ්‍ය ආයතනයන්හි සුමට හා කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සහතික කරනුවස් අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණයන් ක්‍රියාවට නංවන ලදී. තවද, මහජනතාව සඳහා කාර්යක්ෂම හා අර්ථවත් සේවාවක් ලබාදීමට පහසුකම් සලසන පරිදි උප රාජ්‍ය ආයතනවල යටිතල පහසුකම් සහ කළමනාකාරිත්ව හැකියාවන් වැඩි දියුණු කරන ලදී.

**පළාත් පාලන යටිතල පහසුකම් සහ සේවා සැපයුම දියුණු කරන අතරතුර තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව 2012 වසරේ දී "පුර නැගුම" වැඩසටහන ආරම්භ කරන ලදී.** මෙම ව්‍යාපෘතිය යටතේ ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම්, මාර්ග සඳහා ප්‍රවේශයන්, මාතෘ සහ සෞඛ්‍ය මධ්‍යස්ථාන, සති පොළ, වෙළෙඳ සංකීර්ණ, ළමා උද්‍යාන, පුස්තකාල, රථ ගාල්, අවන්හල්, ප්‍රාදේශීය සභා ගොඩනැගිලි ආදිය ඉදි කෙරෙමින් පවතී. එපමණක් නොව, බදුකරණය, තක්සේරු අනුපාත, වෙනත් බදු හා බලපත්‍ර ලබාදීම යනාදියට අදාළ ක්‍රියාවලීන් සරල කිරීම සහ එවැනි බදු අනුමත කිරීමේ විනිවිද පෙනෙන යාන්ත්‍රණ නිර්මාණය කිරීම සහ යටිතල පහසුකම් දියුණු කිරීම තුළින් ප්‍රාදේශීය සභාවලින් ඉටු වන සේවය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ලබාදීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා මෙම වැඩසටහන පහසුකම් සලසයි. පුර නැගුම වැඩසටහනට අමතරව, නාගරික සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ තාක්ෂණික හා උපදේශාත්මක සහය ඇතුව පළාත් පාලන කොමසාරිස් කාර්යාල හා පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවල මැදිහත් වීම මත කුඩා හා මධ්‍ය පරිමාණ නගර සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක් ක්‍රියාවට නංවන ලදී.

**2012 වසර තුළ පළාත් මට්ටමේ යටිතල පහසුකම් දියුණු කිරීමේ ක්‍රියාකාරකම් යටතේ මාර්ග සංවර්ධනය සඳහා මූලිකත්වය ලබා දෙන ලදී.** ඒ අනුව, විපතට පත් වූ පළාත්වල විවිධ මාර්ග සංවර්ධන වැඩසටහන් අඛණ්ඩව දියත් කරන අතරතුර පළාත් මාර්ගවල සම්බන්ධතාව හා විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ප්‍රාදේශීය සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් කිහිපයක් ආරම්භ කළ අතර කොළඹ නගරය තුළ අපජලය හා මළ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය පුනරුත්ථාපනය කෙරෙමින් පවතී. තවද, පළාත්වලට ගිනි නිවීමේ පහසුකම් හා ජීවිත ගලවා ගැනීමේ තාක්ෂණික පහසුකම් ලබාදීම සඳහා ආපදා ප්‍රතිචාර ජාල දියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

**තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කරගැනීමේ අරමුණ ඇතිව 2012 වසර සඳහා පළාත් සභාවලට ලබාදුන් මධ්‍යම රජයේ ප්‍රතිපාදන නිර්දේශ කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලදී.** පළාත් මගින් දැනට අනුගමනය කරන "ප්‍රතිඵල පාදක අධීක්ෂණය" ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව මගින් ආයතනික ප්‍රතිඵල රාමුව ප්‍රවේශය හඳුන්වා දෙන ලදී. මේ යටතේ 2013 සිට 2017 කාලසීමාව සඳහා සෑම පළාතක් වෙනුවෙන්ම මැදිකාලීන ප්‍රතිඵල පාදක රාමුවක් හඳුන්වාදෙනු ලැබීය. මීට අමතරව, මුදල් කොමිෂන් සභාව 2012 වසර සඳහා පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන යටතේ ලබාදෙන රජයේ පැවරුම් නිර්දේශ කිරීමේ දී වතු යටිතල පහසුකම්, සංස්කෘතික

සබඳතා සහ පළාත් පාලන ආයතන යටතේ ඇති මාර්ග නමින් නව ක්ෂේත්‍ර තුනක් හඳුන්වා දෙන ලදී. මේ අතර, කොමිෂන් සභාවට අනුව, පළාත් සඳහා ව්‍යාපෘතිවලට ප්‍රාග්ධන ස්වභාවයෙන් ලැබෙන අරමුදල් ප්‍රමාණවත් නොවීම 2012 වසරේ දී පළාත් සභාවල මෙහෙයුම් කටයුතුවලට බලපෑ මූලික ගැටලුවක් විය.

### පළාත් සභාවල අයවැය කටයුතු

පළාත් සභාවල සමස්ත ආදායම 2011 වසරේ වූ රුපියල් බිලියන 40.1 ට සාපේක්ෂව 2012 වසරේ දී රුපියල් බිලියන 47.4 දක්වා සියයට 15.7 කින් වැඩි විය. කෙසේ වුවද, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මුළු ආදායම 2011 වසරේ පැවති සියයට 0.6 ක අගයේම පැවතිණි. 2012 වසර තුළ බදු ආදායම සියයට 18 කින් රුපියල් බිලියන 41.0 දක්වා ඉහළ ගිය අතර බදු නොවන ආදායම සියයට 0.5 කින් රුපියල් බිලියන 6.4 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය. මධ්‍යම රජයෙන් පවරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද සියයට 19.7 කින් රුපියල් බිලියන 18.6 දක්වා ඉහළ ගිය අතර තොග සහ සිල්ලර වෙළෙඳාමේ ලියාපදිංචිය වේගවත් කිරීමට ගත් ක්‍රියාමාර්ගයන් සමග ජාතිය ගොඩනැගීමේ බදු පදනමේ සිදුවූ පුළුල් වීම ද මෙයට හේතු විය. මීට අමතරව, මුද්දර බද්දෙන් හා ලියාපදිංචි ගාස්තුවලින් ලද ආදායම ද මෙම කාලසීමාව තුළ දී ඉහළ ගියේය. පෙර වසරවල පරිදිම 2012 වසරේ දී ද පළාත් සභාවල සමස්ත ආදායමට වැඩිම දායකත්වය බස්නාහිර පළාත් සභාව මගින් ලද අතර එය පළාත් සභාවල සමස්ත ආදායමෙන් සියයට 53 කි. බස්නාහිර පළාතට පසුව වයඹ, මධ්‍යම හා දකුණු පළාත් පිළිවෙළින් සියයට 10, සියයට 9 සහ සියයට 9 බැගින් සමස්ත ආදායමට දායක විය.

**6.10 සංඛ්‍යා සටහන — පළාත් සභාවල අයවැය තත්ත්වය**

රුපියල් මිලියන

| ශීර්ෂය | 2009 | 2010 | 2011 | 2012 තාවකාලික |
|---|---|---|---|---|
| **මුළු ආදායම** | **29,433** | **36,829** | **40,990** | **47,410** |
| බදු ආදායම | 24,907 | 31,049 | 34,658 | 41,044 |
| බදු නොවන ආදායම | 4,526 | 5,780 | 6,332 | 6,365 |
| **මුළු වියදම** | **130,260** | **145,491** | **157,373** | **159,516** |
| වර්තන වියදම් | 111,336 | 119,162 | 129,600 | 136,153 |
| එයින් වැටුප් හා වේතන | 86,547 | 91,644 | 101,886 | 101,374 |
| ප්‍රාග්ධන වියදම් | 18,924 | 26,329 | 27,773 | 23,363 |
| **මධ්‍යම රජයේ පැවරුම්** | **93,999** | **107,032** | **116,383** | **112,106** |
| සාමූහික ප්‍රදාන | 77,386 | 85,299 | 94,603 | 91,892 |
| උපමාන පාදක ප්‍රදාන | 2,276 | 2,612 | 3,854 | 2,861 |
| පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන | 10,945 | 11,683 | 9,953 | 5,901 |
| විශේෂ යෝජනා ක්‍රම සඳහා විදේශීය ප්‍රදාන | 3,393 | 7,439 | 7,973 | 11,452 |

මූලයන්: පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

වර්තන වියදම් තාර්කිකකරණය කිරීම සඳහා රජය දරන උත්සාහයන් පිළිබිඹු කරමින් 2012 වසර තුළ පළාත් සභාවල වර්තන වියදම් සියයට 5 කින් රුපියල් බිලියන 136.2 දක්වා වැඩිවිය. කෙසේ වුවද, එය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තා කළ සියයට 2 හා සසඳන කල 2012 වසරේදී සියයට 1.8 ක් දක්වා පහත වැටුණි. 2012 වසරේ පළාත් සභාවල මුළු වර්තන වියදමින් සියයට 74 ක් වාර්තා කරමින් වැටුප් හා වේතන විශාලතම තනි අයිතමය ලෙස තවදුරටත් පැවතුණි. වැටුප් හා වේතන වියදම් යටතේ අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශයේ පුද්ගල පඩිනඩි මුළු වේතන වියදමින් සියයට 90 ක් පමණ විය. කාර්යයන් අනුව වර්ගීකරණ පදනම අනුව, ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය හා සෞඛ්‍යය අංශ ඇතුළත්ව සමාජ යටිතල පහසුකම් සඳහා වර්තන වියදම රුපියල් බිලියන 119.6 ක් වූ අතර, එය 2012 වසරේ මුළු වර්තන වියදමින් සියයට 88 කි. වර්තන වියදම්වල ඉතිරි කොටස පළාත් පරිපාලන වියදම්, ආර්ථික යටිතල පහසුකම්, කෘෂිකර්මය හා කර්මාන්ත ආදී අංශ කෙරෙහි යොමු විය. මේ අතරතුර, මුළු වර්තන වියදමින් සියයට 22 කට දායක වෙමින් බස්නාහිර පළාත් සභාව විශාලතම වියදම් ඒකකය බවට පත්විය.

මධ්‍යම රජයේ ප්‍රාග්ධන පැවරුම්වල පහළයාම පෙන්නුම් කරමින් 2012 වසර තුළ පළාත් සභාවල ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 23.4 දක්වා සියයට 16 කින් අඩු විය. ඒ අනුව, මධ්‍යම රජයේ රාජ්‍ය ආයෝජන ඇස්තමේන්තුවලට වඩා පහළ යාම හා සමගාමීව යමින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම පෙර වසරේ වූ සියයට 0.4 සිට සියයට 0.3 දක්වා 2012 වසරේ දී අඩු විය. විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති 2012 වසර තුළ ප්‍රාදේශීය මට්ටමේ ආයෝජනවලින් ප්‍රධාන කොටස වූ අතර එය රුපියල් බිලියන 11.5 ක් විය. පළාත් මාර්ග ව්‍යාපෘති, උතුරු පළාත් මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය, නැගෙනහිර පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය, දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය හා සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘති 2012 වසරේ පළාත් මට්ටමින් දියත් කළ විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වුන ප්‍රධාන ව්‍යාපෘතීන් වූ අතර, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර ජපන් සහයෝගීතා ආයතනය

සහ ලෝක බැංකුව වැනි අන්තර්ජාතික සංවර්ධන ආයතන ඒ සඳහා නොකඩවා ආධාර ලබාදෙන ලදී. මීට අමතරව, පළාත් විශේෂිත සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා 2012 වසර තුළ දී රුපියල් බිලියන 5.9 ක් වැය කළ අතර, සෙසු පළාත් මට්ටමේ ආයෝජන සඳහා රුපියල් බිලියන 6.1 ක් වැය කරන ලද්දේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම හා වැඩිදියුණු කිරීම සහ ප්‍රාග්ධන පැවරුම් වෙනුවෙනි.

**මධ්‍යම රජයේ පැවරුම් 2011 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 115.9 හා සසඳන කල 2012 වසර තුළ රුපියල් බිලියන 112.1 ක් දක්වා සියයට 4 කින් පහළ ගියේය.** මෙම පැවරුම් සාමූහික ප්‍රදාන, උපමාන පාදක ප්‍රදාන, පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන හා විශේෂ ව්‍යාපෘති සඳහා දුන් ප්‍රදාන යන ස්වභාවයන්ගෙන් යුක්ත විය. පළාත් සභාවල වර්තන වියදම් වැඩසටහනේ සම්පත් පරතරය පියවීම සඳහා රුපියල් බිලියන 91.9 ක් (සමස්ත පැවරුම්වලින් සියයට 82 ක්) ලබාදෙමින් සාමූහික ප්‍රදාන මධ්‍යම රජයේ පැවරුම්වල ප්‍රධාන අංශය විය. මීට අමතරව, 2012 වසර සඳහා විශේෂිත පළාත් සංවර්ධන වැඩසටහන් සඳහා පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන යටතේ දුන් පැවරුම්, අභිමත වියදම් අවශ්‍යතා සඳහ වන උපමාන පාදක ප්‍රදාන සහ විශේෂ ව්‍යාපෘති සඳහා දුන් ප්‍රදාන පිළිවෙළින් රුපියල් බිලියන 5.9, රුපියල් බිලියන 2.9 හා රුපියල් බිලියන 11.5 ක් විය. මේ අතර, පළාත් සභාවල සමස්ත වියදමින් සියයට 70 පමණක් මධ්‍යම රජයේ පැවරුම්වලින් මූල්‍යනය කළ අතර, එය පෙර වසරේ දී සියයට 74 ක් විය. පළාත් ආදායම ඉහළ යාමත් සමග මෙවැනි ප්‍රවණතාවයක් අඛණ්ඩව පැවතීම පළාත් සභා මධ්‍යම රජය මත දක්වන රැඳියාව අවම කිරීමට අවශ්‍යවනු ඇත.

### රජයේ ඒකාබද්ධ අයවැය කටයුතු

**මෙම වාර්තාවේ 112 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය සඳහා වූ ඒකාබද්ධ අයවැය මගින් රජයේ ක්‍රියාකාරකම්වල සමස්ත බලපෑම පෙන්නුම් කරයි.** ඒකාබද්ධතාවය යනු ඒකක හෝ ආයතන කිහිපයක් එක් ඒකකයක් ලෙස ස්ථාපනය කළහොත් ඒ සඳහා සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ලෙස රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන අත්පොත (Government Finance Statistic manual 1986) නිර්වචනය කරයි. පොදු රාජ්‍ය අංශය (General Government Sector) යනු රටක ක්‍රියාත්මක වන සෑම රාජ්‍ය ඒකකයක්ම ඒකාබද්ධ කිරීම වන අතර, පොදු රාජ්‍ය අංශය මධ්‍යම රජය, ජනපද, පළාත් හෝ ප්‍රාදේශීය රාජ්‍ය, මහනගර සභා, පාසල් මණ්ඩල හා වෙනත් ආයතන ඇතුළත් පළාත් පාලන ආයතන සහ රට තුළ බදු සහ රාජ්‍ය වියදම් කාර්යයන් ක්‍රියාත්මක කරනු ලබන ජාතික සීමාවන් ඉක්මවා යන අධිකාරීන් යන උප අංශයන්ගෙන් සමන්විත වේ. රජයේ අයවැය කටයුතු ඒකාබද්ධ නොකළ සංඛ්‍යාලේඛන වෙනුවට ඒකාබද්ධ කරන ලද සංඛ්‍යාලේඛන කාණ්ඩයන් ලෙස මැනීම මගින්, රජයේ අයවැය කටයුතුවල සමස්ත බලපෑම හෝ තිරසාර බව වඩා එලදායී ලෙස තක්සේරු කළ හැක. තවද, රටවල්වල පවතින විවිධ පරිපාලන ව්‍යුහයන්හි සමස්තය සැලකීමේ දී සිදුවිය හැකි විකෘති වීම ඒකාබද්ධ කිරීම මගින් මගහැරෙන අතර, රාජ්‍ය මූල්‍ය ඇගයීම හා ජාත්‍යන්තර සංසන්දනාත්මක භාවය එමගින් වැඩිදියුණු වේ. ඉහත කරුණු සලකා බලා, මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන අතර ඇති ගෙවීම් හා ලැබීම් ඉවත් කර ඒවායේ අනෙකුත් ගනුදෙනු ඒකරාශී කිරීම මගින් ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය කටයුතු සඳහා ඒකාබද්ධ අයවැයක් සකස් කර ඇත.